පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.
කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය

වෙළුම 6, අංක 2 | 2002 මැයි - ජූනි

# කෙසෙල් කැන් ආවරණයට වියන ලද පොලිසැක් බෑග්

කෙසෙල් කැන් ආවරණය කැන්වල බර වැඩිකර ගැනීම සඳහාත් වැඩි පෙනුමකින් යුතු පැල්ලම් රහිත කැන් සඳහාත් පැරැන්නේ සිට භාවිතා කළ ක්‍රියාවලියකි. පොල් අතු වලින් වියන ලද කුඩා හෝ කෙසෙල් පඬරැල් භාවිතයෙන් ආවරණය සාම්ප්‍රදායික ක්‍රමයයි. නිල් පැහැති පොලිතීන් බෑග් වලින් ආවරණය වර්තමානයේ බහුලව භාවිතා වේ. මෙම පොලිතීන් භාවිතයේදී විශේෂයෙන්ම වියළි කලාපයේ වගාවන්වල කෙසෙල් කැන්වල හිරු රශ්මියට බඳුන් වූ ස්ථාන පිළිස්සීම සහ ගෙඩිවල අභ්‍යන්තර කොටස් දුඹුරු පැහැවීම සෘණාත්මක බලපෑම් ලෙස හැඳින්විය හැක.

මේ නිසා වියළි කලාපීය කෙසෙල් වගාවනට භාවිතා කළ හැකි යෝග්‍ය ආවරණ ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා පර්යේෂණ අඟුණකොළපැලැස්ස මාශ හා තෙල් බෝග පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. නිල් පොලිතීන්, සුදු පොලිතීන්, වර්ණ රහිත පොලිතීන්, මැක්බොලන් ආයතනයෙන් සැපයූ මැක්පෝම් පොලිතීන් සහ වියන ලද පොලිසැක් බඳුන් මේ සඳහා භාවිතා විය.

භාවිතා කළ ද්‍රව්‍ය නොසලකා හැරියද කැන් ආවරණය නිසා කැන්වල බර 37% කින් වැඩි විය. භාවිතා කළ ද්‍රව්‍යවල වර්ණය කැනෙහි හෝ ගෙඩිවල බරට බලපෑමක් නොවූ නමුත් බාහිර පෙනුමට බලපෑමක් විය. වර්ණ රහිත පොලිතීන් බඳුන් භාවිතා කළවිට හිරු රශ්මිය නිසා ගෙඩි පිළිස්සීම සිදුවිය. භාවිතා කළ ද්‍රව්‍ය අතුරින් වියන ලද පොලිසැක් බෑග් අවම ලෙස දෙවරක් භාවිතා කළ හැකි අතර, අනෙක් සියලුම බඳුන් වරක් පාවිච්චි කළ පසු ඉවත් කිරීමට සිදුවේ. මේ නිසා වියන ලද පොලිසැක් බඳුන් මඟින් ආවරණය සඳහා වැයවන මුදල රු: 6.00 ක් පමණක් වේ. තවද මෙය පොලිතීන් හා සසඳන විට ඉවත් කල පසු පහසුවෙන් විනාශ වේ. වියන ලද ද්‍රව්‍යයක් නිසා සමබරතාව සහිත බැවින් කැනෙහි ගෙඩි අතර ක්ෂුද්‍ර පරිසරය වඩාත් හිතකර වේ. සිදුරු ඇති කිරීමක් අවශ්‍ය නොවේ. මේ නිසා වියන ලද පොලිසැක් බඳුන් වියළි කලාපීය කෙසෙල් කැන් ආවරණය සඳහා වඩාත් යෝග්‍ය ආවරණ ද්‍රව්‍ය වේ.

මූලාශ්‍රය: *එස්.එස්.විරසිංහ, පර්යේෂණ නිලධාරී සහ කේ.එම්.රුවන් පතිරණ, පර්යේෂණ සහකාර, මාශ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, අඟුණකොළපැලැස්ස.*

# කෙසෙල් සමූහ වගාව (Group Plantation)

බහුවාර්ෂික හෝ අර්ධ බහු වාර්ෂික බෝගයක් ලෙසට සාමාන්‍යයෙන් එක් පඳුරක පැල 4 ක් හෝ එයට වැඩි ප්‍රමාණයක් තිබෙන ලෙසට කෙසෙල් වගාවක් නඩත්තු කරනු ලැබේ. සමීක්ෂණ වාර්තා වලට අනුව දැනට පවත්නා කෙසෙල් වගා වලින් 85% කටත් වඩා වැඩි ප්‍රමාණයක් කෙසෙල් ඉරි වෛරසය සහ මුහ වෛරසය වැනි වෛරස් රෝග වලින් ආසාදනය වී ඇති නමුත් තවමත් ඵලදායි ලෙස තිබෙන බව පෙනේ. කෙසේ නමුත් මව් ගාබයේ සිට 4 වන නිරි වගාව අවස්ථාව දක්වා යන විට 10-40% ක පමණ අස්වැන්නේ ක්‍රමික අඩුවීමක් දක්නට ලැබේ. එයට අමතරව වාණිජ වශයෙන් වැදගත් වන කෝලිකුට්ටු සහ අලු කෙසෙල් ප්‍රභේද පැනමා මැලවීම (පියුසේරියම් මැලවීම) සහ පීදෙන අවධියේදී වළ පීදීම වැනි රෝගී තත්ත්වයන්ට වඩාත් භාජනය වේ.

වාර්ෂික බෝගයක් ලෙස කෙසෙල් වගා කිරීමේදී මව් ශාකය පමණක් නඩත්තු කිරීමෙන් මෙම රෝග නිසා නිරි වගාවන්වල අස්වනු




හානිවීම වැළකේ. මෙම ක්‍රමය නිසා විශාල ප්‍රමාණයෙන් රෝග පැතිරීමද වළකී.

වාර්ෂික බෝගයක් ලෙස කෙසෙල් පහත සඳහන් ලෙස වගා කළ හැකිය. මීටර් 3×3 පරතරයට ක්ෂේත්‍රයේ කුඤ්ඤ ගසනු ලැබේ.

එය වටා ත්‍රිකෝණ ක්‍රමයට සෙ.මී.30×30×30 ප්‍රමාණයේ වලවල් කපනු ලැබේ. (රූප සටහන බලන්න.)

මෙම වළවල් කොම්පෝස්ට් සහ මූලික රසායන පොහොර මිශ්‍රණයෙන් පුරවන්න. යූරියා ග්‍රෑම් 120 ක්, ත්‍රිත්ව සුපර්පොස්පේට් ග්‍රෑම් 80 ක් සහ මියුරියේට් ඔෆ් පොටෑෂ් ග්‍රෑම් 250 ක් මිශ්‍රකර මූලික පොහොර මිශ්‍රණයෙන් ග්‍රෑම් 450 ක් සාදනු ලැබේ. කාබනික ද්‍රව්‍ය එකතු කරන්නේ නම් එය සමඟ ඉහත මිශ්‍රණයෙන් ග්‍රෑම් 225 ක් හෝ එම මිශ්‍රණයෙන් ග්‍රෑම් 450 ක් එක් වලකට දමා පස් සමඟ මිශ්‍රකර පැළ සිටවනු ලැබේ. එක් කුඤ්ඤයක් වටා සිටුවන පැළ 3 එකම ප්‍රභේදයෙන් හා එකම විශාලත්වයෙන් යුතුවීම අවශ්‍ය වේ. මෙම පැළ තුනම තනි පැළ ලෙස නඩත්තු කරන අතර, ඒවායින් හට ගන්නා සියලුම මොරෙයියන් ඉවත් කරනු ලැබේ. මාස 3-4 කට වතාවක් මූලික පොහොර මිශ්‍රණය සඳහා භාවිතා කල පොහොර මිශ්‍රණයම භාවිතා කරන්න. පොලිසැක් බෑග් වලින් ආවරණය කිරීමෙන් කැන්වල බර හා පෙනුම වැඩිකර ගත හැකි වේ. අස්වනු නෙලාගත් පසු ව්‍යාජ කඳ පොළොව මට්ටමෙන් කපා දමා භූගත කොටසින් මොරෙයියන් මතුවීමට ඉඩ හරින්න. ඉහත විස්තර කල ආකාරයටම අස්වනු නෙලූ පැළ අතුරින් නව වගාවක් නැවත ආරම්භ කළ හැක.

රෝග පැතිරීම අවමවීම, තුන් ගුණයකින් අස්වනු වැඩිවීම සහ ආදායම් හානියක් නොමැතිව එම භූමිය බෝග මාරුවක් සඳහා භාවිතා කළ හැකිවීම මෙම වගා ක්‍රමයේ ප්‍රධාන වාසි ලෙස හැඳින්විය හැක.

**මූලාශ්‍රය:** ***එස්.එස්.වීරසිංහ, පර්යේෂණ නිළධාරී, කේ.එච්.රුවන් පතිරණ, පර්යේෂණ සහකාර, මාශ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, අඟුණකොලපැලැස්ස.***

# ශ්‍රී ලංකාවේ ඇපල් වගා කිරීමේ සාධ්‍යතාව

ඇපල් පොමොඩියේ උප කුළයට අයත් වේ. මෙම උපකුලයට පෙයාර්ස්, ක්වින්ස් සහ මෙඩ්ලර් වැනි පලතුරු බෝගයන් අයත් වේ. මේ සියල්ල සමශීතෝෂ්ණ දේශගුණ කලාප බෝග වේ. මේ සියලු පලතුරු වර්ග පෝම් (Pome) ආකාර බිජ රාශියක් සහිත පලතුරු වේ. ඵලයේ පිටත මාංශලය විශාල වූ පාදය සහිත මල්පෙති නාලයෙන් හා ඇතුලත මාංශලය ඩිම්බ කෝෂ පටක වලින් සංයුක්ත වී ඇත. අනෙකුත් සියළුම විශේෂ වලට වඩා පුළුල් පරාසයක වගා කළ හැකි සෞම්‍ය කලාපීය බෝගය ලෙස ඇපල් හැඳින්වේ. දැනට වගා කරන ඇපල් වගා දර්ශ මූලිකව මැලස් පුමිලා මිල් *(Malus pumila mill.)* වලින් විභේදනය වී ඇත. මැලස් පුමිලා දර්ශ වල ආරම්භය නිරිත දිග ආසියාතික කළාපයේ (රුසියාව, ඉරානය සහ ටර්කිස්ථානය) වන අතර 6 වන ශත වර්ෂයේදි ඇපල් යුරෝපයට හඳුන්වා දී ඇත.

සාමාන්‍ය ඇපල් ගාකයක් විශාල බහු වාර්ෂික ගාකයක් ලෙස මීටර් 15-18 ක් උසට වැඩේ. කෙසේ නමුත් ග්‍රාහකයේ වර්ධනය පාලනය කිරීම තුළින් ගාකයේ වර්ධනය මීටර් 2-3 ක් පමණ උසට සීමා කළ හැකි වේ. වර්ධකව ප්‍රචාරණය කළ ග්‍රාහක ඇපල් ක්ලෝන රාශියක් ඇති අතර, විවිධ ක්ලෝන මඟින් ඒවාට විශේෂිත උසකට පැළයේ උස අඩු කිරීම සිදුවේ. පත්‍රමය කෙටි නටුව කෙළවර පොකුරක් ලෙස ඇපල් මල් හට ගන්නා අතර, ඒවා රෝසමය සුදු පැහැවේ. ප්‍රභේදය අනුව ගෙඩිවල පැහැය කොළ, කහ හෝ රතු වේ. සාමාන්‍යයෙන් ඇපල් ගාක අනෙකුත් පලතුරු විශේෂ වලට වඩා දැඩි ශීත තත්ත්ව වලට ඔරොත්තු දේ. අවම වශයෙන් පැය 6.00 ක කාලයක් පැරන්හයිට් අංශක 48 උෂ්ණත්වයකට ඇපල් ගාකයන් නිරාවරණයව තිබීම සාර්ථක ලෙස මල් හටගැනීම සඳහා අවශ්‍ය වේ. මීටර් 1500 ට ඉහළ ශ්‍රී ලංකාවේ උඩරට ප්‍රදේශයේ ස්ථානවල මෙම තත්ත්ව දක්නට ලැබේ.

පසුගිය කාලය තුළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඇපල් වගාව ව්‍යාප්ත කිරීම සඳහා උත්සාහයන් රාශියක් දරා ඇත. පළමුවෙන්ම 1950 ගණන් වල එක්සත් රාජධානියෙන් ඇපල් ප්‍රභේද ගෙන්වා ශ්‍රී ලංකාවට හඳුන්වා දීමට උත්සාහ දරා ඇත. මෙම ප්‍රභේද රහන්ගල ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයේ වගාකර පරීක්ෂා කරන ලදි. (ආනයනය කරන ප්‍රභේද හා සංසන්දනය කළවිට) මෙම ප්‍රභේද රසවත් ගුණාත්මයෙන් ඉහළ ගෙඩි නිෂ්පාදනය කරයි. කෙසේ නමුත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හඳුන්වා දීමට පෙර නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික්කයේ පෞද්ගලික පළතුරු උද්‍යානවල හා ගෙවතුවල ඉතා සාරවත්ව වගා වූ ඇපල් ගාක 100 ක් පමණ විය. මෙම ගාක වලින් සමහරක් ඉහළ අස්වනු ලබා දුන් අතර, එනම් සෑම වසරකම අගෝස්තු - ඔක්තෝබර් මාසවල ගෙඩි 1500 ක් පමණ ලබා දුනි. මේ අනුව පැහැදිලි වන්නේ ඉතිහාසයේ වාර්තා නොවූ නමුත් බ්‍රිතාන්‍ය පාලකයන් ශ්‍රී ලංකාවේ ඇපල් වගා කිරීමට උත්සාහ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම ඇපල් ප්‍රභේද හඳුන්වා දී ඇති බවයි.

මෙම මුලිකම හඳුන්වා දුන් ප්‍රභේද වල ස්වභාවය පැහැදිලි නැති වුවත් එහි ආකාර 2 ක් ඇති බව කෘෂි විද්‍යාඥයින් විශ්වාස කරයි. පසුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මෙම ප්‍රභේද දෙක රහන්ගල තේරීම සහ රාගල ඇපල් ලෙස නම් කර ඇත. මෙම

ප්‍රභේද දෙකෙහි පැළ රහන්ගල කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය, බණ්ඩාරවෙල ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය, බිඳුනුවැව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය සහ ඓතිහාසික හපුතලේ ඇඩිෂැම් බංගලාවෙහි දක්නට ලැබේ.

නටුව ආසන්නයට වූ රතු පැහැය සහිත කොළ පැහැති ගෙඩි සහිත රාගල ප්‍රභේදය ගත වර්ෂ කීපයකට පෙර යුරෝපයේ සහ ඕස්ට්‍රේලියාවේ වගා කළ පිසීම සඳහා (cooking type) භාවිතා කළ වගා දර්ශයන් බව පැළෑටි විද්‍යාඥයින් විශ්වාස කරයි. ශ්‍රී ලාංකීය පරිසර තත්ත්ව යටතේ ඵල දැරීම සිදු නොවන රහංගල ප්‍රභේදය, භාවිතා කළ ග්‍රාහක ශාකයක් ලෙසත් පෙන්නුම් කෙරේ.

1950 ගණන්වල හඳුන්වා දුන් ප්‍රභේදවල සාර්ථකත්වය සමඟ ශ්‍රී ලංකාවේ ඉහළ උච්චත්වය සහිත ප්‍රදේශවල ඇපල් වගා කළ හැකි බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ස්ථිර කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස නව සහ වඩාත් සුදුසු ග්‍රාහක සහ අනුජ ප්‍රභේද හඳුන්වාදීම සිදුවිය. විවිධ ග්‍රාහක අනුජ සම්බන්ධතා, බද්ධ කිරීමේ ක්‍රම සහ ශෂ්‍ය ක්‍රම පිළිබඳ සවිස්තරාත්මක පර්යේෂණ ආරම්භ විය. රෝම්බියුටි, ට්‍රොපිකල් බියුටි, ලෝඩ්, ක්‍රිම්සන් ඩිලිෂස්, රෙඩ් ඩිලිෂස් සහ ඉඩා රෙඩ් වැනි ඉතා ප්‍රසිද්ධ ප්‍රභේද හඳුන්වාදීම කෙරුණි.

රහන්ගල කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයේ පැවැත්වූ පර්යේෂණ වලට අනුව අනෙකුත් ප්‍රභේද හා සංයුතීන්ට වඩා රාගල සහ රහන්ගල ග්‍රාහක සංයුතීන් සමඟ රෝම් බියුටි අනුජය ඉතා හොඳ වර්ධනයක් හා සබඳතාවයක් පෙන්නුම් කරන ලදී. මෙහිදී රාගල ප්‍රභේදය රහංගල ග්‍රාහකයට බද්ධකර පසුව රෝම්බියුටි ප්‍රභේදය රහන්ගල - රාගල සංයෝජනය සඳහා බද්ධ කරනු ලැබිය. මෙම සංයුතිය සහිත ප්‍රභේදය ගෙවතු ශාකයක් ලෙස හොඳින් වගාවේ. කෙසේ නමුත් එක් ශාකයක් වසරකට ගෙඩි 300 ක් පමණ ලබාදෙන බැවින් වාණිජ ලෙස මෙයට ඇති විභවය තවදුරටත් සොයා දැනගත යුතුව තිබේ.

*මූලාශ්‍රය: ආචාර්ය පී.එම්.විජේරත්න, නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ, ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, බණ්ඩාරවෙල සහ බන්දුල හේමචන්ද්‍ර, ස්ථාන භාර නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය, රහන්ගල.*

## අඹතැන්න - ඉහළ ගුණාත්මයේ නව දූරියන් ප්‍රභේදයක්

බොම්බසියේ කුළයට අයත් දූරියන්, වාරයට ඵල දරන, ආසියාතික රටවල ජනප්‍රිය පළතුරකි. එහි මාංශලය අධිශීත කර හෝ සැකසීම තුළින් පල්පයක් ලෙස කල්තබාගත හැකිය. මාංශලයෙන් සකසා ගත් කුඩු අයිස්ක්‍රීම්, කේක්, චිප්ස් සහ වෙනත් රසකැවිලි නිෂ්පාදනය සඳහා භාවිතා කළ හැකිය.

බහුලව වගාවෙන විශේෂය දූරියෝ සිබතෙනිස් (Durio zibethinus J. Murr.) වේ. මෙම ශාඛය බෝර්නියෝ දූපත්වල සම්භවය වී නිවර්ථන රටවල් කරා ව්‍යාප්ත වී ඇත. දැන් එය තායිලන්තය, මැලේසියාව, බෘනයි, ඉන්දුනීසියාව සහ පිලිපීනය වැනි රටවල බහුලව වගා වේ. තායිලන්තය දූරියන් අපනයන කරන ප්‍රධානතම රටවන අතර, පිළිවෙලින් මැලේසියාව හා ඉන්දුනීසියාව දෙවෙනි හා තෙවෙනි අපනයනකරුවන් වේ. 1850 දී මැලේසියාවෙන් දූරියන් ශ්‍රී ලංකාවට හඳුන්වා දී ඇති අතර, ඒවා පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සිටුවා ඇත. ආන්තික ඉඩම්වල දූරියන් වඩාත් ලාබදායි වේ.

ඵල පිහිටීම සඳහා පරපරාගනය වීම දූරියන් සඳහා අත්‍යාවශ්‍යයෙන්ම සිදුවිය යුත්තකි. දිගටම බීජ මඟින් පැළ ප්‍රචාරණය හා විෂමයෝගී ස්වභාවය නිසා විවිධ ලක්ෂණ සහිත ප්‍රභේද දක්නට ලැබේ. නමුත් මෙම ශාක තේරීමක් සිදු නොවුන බැවින් හොඳ ලක්ෂණ සහිත ප්‍රභේද නිර්දේශ කිරීම කර නොතිබුණි. මේ නිසා ශාක වරණය 1991 දී ආරම්භ වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ගුණාත්මයෙන් ඉහළ ප්‍රභේදයන් 2002 ජුනි මසදී නිර්දේශ කිරීම සඳහා තෝරා ගන්නා ලදී. මෙය අඹතැන්න නමින් හැඳින්වෙන අතර එය ගුණාත්මයෙන් ඉහළ මාංශලය ඝනකම සහිත (වරකා ආකාර) ප්‍රභේදයක් වේ. ඵල රසවත් භාවය සහිත වේ. හඳුනා ගන්නා ලද මව් ශාකය අවුරුදු 25 ක් පමණ වයසැති වන අතර, ගෙඩි 100-200 ක් පමණ ඵල දරයි. ඕවලාකාර හැඩයෙන් යුතු ගෙඩි පරිණත වනවිට කහ කොළ පැහැයක් ගනී. ඝනකම මාංශලය ක්‍රීම් පැහැයෙන් යුතු වේ. එහි ආහාරයට ගත හැකි කොටස ප්‍රමාණයෙන් වැඩිය. (32%) මධ්‍යම සුවඳකින් යුතු මාංශලයේ තෙතමනය 58% ක් වන අතර, පි.එච්.අගය 6.7 ක්, කෙඳි 0.7%ක්, මේදය 4.9 ක් අඩංගු වේ. ගෙඩිවල බර කි.ග්‍රෑ.1-3 ක් අතර වන අතර සාමාන්‍යය කි.ග්‍රෑ. 1.6 ක් වේ. තරමක් බොකු ගැසුනු (concave) මධ්‍යම ප්‍රමාණ කටු සහිත ලෙල්ලකින් යුතු වේ. ගෙඩිය කාපල 5 ක් සහිත වන අතර, එක් කොටසක බීජ 9-18 ක් අඩංගු වේ. කුඤ්ඤ බද්ධ ක්‍රමයට මෙම ප්‍රභේදය ප්‍රචාරණය කරගත හැකිය.

*මූලාශ්‍රය: අයි. මැදගොඩ මිය, පර්යේෂණ නිලධාරී, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නෝරුව.*

# ප්‍රෙන්ච් එම්අයි (French MI)- සුදු වයින් සඳහා මිදි ප්‍රභේදයක්

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් පළතුරක් ලෙස පරිභෝජනය කළහැකි මිදි (විටිස් විනිපෙරා) ප්‍රභේද 4 ක් වගා කිරීම සඳහා නිර්දේශ කර ඇති අතර, ඒ අතුරින් මස්කට් එම්අයි ප්‍රභේදය වයින් සෑදීම සඳහා භාවිතා කළ හැකි වේ. කෙසේ නමුත් මෙම ද්විකාර්යය ප්‍රභේදය රතු වයින් නිෂ්පාදනය සඳහා භාවිතා වේ. වයින් සෑදීම සඳහා සුදුසු මිදි ප්‍රභේදයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිර්දේශ කර නොමැති බැවින් 2002 ජුනි මසදී නව මිදි ප්‍රභේදයක් නිර්දේශ කරන ලදි. එය ප්‍රෙන්ච් සිටි අයි (French MI) නම් විය. මෙය වියළි කලාපයේ සහ අන්තර් මාධ්‍ය කලාපයේ වියළි ප්‍රදේශවල වගාව සඳහා යෝග්‍ය වන අතර, යටි පුස් හා පිටි පුස් රෝගවලට මධ්‍යස්ථ ලෙස ප්‍රතිරෝධ වේ.

මෙම ප්‍රභේදය කැලිෆෝනියාවෙන් හඳුන්වා දුන් ප්‍රෙන්ච් කොලොම්බාඩ් ප්‍රභේදයේ වරණයකි. මෙය දිලීර රෝගවලට එතරම් භාජනය නොවන අතර හඳුන්වා දී ඇති, අතුරුපසට භාවිතා කරන මිදි ප්‍රභේද මෙන් නොව කන්න අනුව අස්වැන්නේ වෙනස්වීම එතරම් දක්නට නොලැබේ. මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී මස්කට් එම්අයි ප්‍රභේදය වඩා වැඩි මිදි පොකුරු ප්‍රමාණයක් ලබා දුනි.

ගෙඩි කුඩා අතර, රසවත්භාවයෙන් අඩුය. බ්‍රික්ස් අගය 10-14% පමණ වේ. ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 1.5 ක් සහ පොත්ත/පල්පය බර අනුපාතය 0.17 ක් පමණ වේ. ගෙඩි ඉදෙන විට පොත්තේ වර්ණය කහ කොළ පැහැයක් ගනී. පීඑච් අගය 3.1 ක් පමණ වේ. මෙම ප්‍රභේදය අතු කැබලි මුල් ඇද්දවීම මඟින් හෝ ග්‍රාහක වලට බද්ධ කිරීමෙන් ප්‍රචාරණය කරගත හැක. පැළ සිටුවා වසරකට පසු අස්වනු නෙලීම කළ හැකි අතර, ආර්ථික ජීවිත කාලය අවුරුදු 30 ක් පමණ වේ. එය ශක්තිමත්/දිරිමත් වර්ධනයක් සහිත වන අතර, කෙටි පර්ව සහිත තද දුඹුරු පැහැති වැල් වලින් යුතුය.

| කන්නය | 98 යල | 98/99 මහ | 99 යල | 99/00 මහ | 00 යල | 00/01 මහ | 01 යල | 01/02 මහ |
|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රෙන්ච් එම් අයි | 5.3 | 1.2 | 11.0 | 9.1 | 7.8 | - | 15.7 | 32.6 |
| මස්කට් එම් අයි | 3.0 | 3.1 | 11.5 | 1.2 | 7.9 | - | 12.5 | 5.0 |

වර්ධනය වන අතු ලා කොළ පැහැති වේ. කෙටි ලාකොළ පැහැති පහුරු සුළු ප්‍රමාණයක් දැකිය හැකිය. දිග හැරෙන පත්‍ර වල උඩ පෘෂ්ඨය අළුමය කොළ පැහැවන අතර, යටි පස රිදීමය සුදු පැහැ වේ. හොඳින් වැඩුණු පසු පත්‍ර කණ්ඩිකා 5 කින් යුතු වන අතර, එයින් 3 ක් වඩාත් පැහැදිලි වේ. පත්‍ර තලයේ උඩ අපිචර්මය සිනිඳු (smooth) වන අතර, යටි අපිචර්මය බූව සහිත වේ.

පුෂ්ම මංජරී 3 - 6 දක්වා වන ගැට වල හටගන්නා නමුත් බහුලව හටගන්නේ 4 සහ 5 වන ගැට වල වේ. මල් ද්විලිංගිකය. කප්පාදුවෙන් සති 1-2 කට පසුව පුෂ්ප මංජරි හට ගැනීම දක්නට ලැබේ.

මධ්‍යස්ථ විශාලත්වයෙන් යුතු ගෙඩි පොකුරු සංගත සිලින්ඩරාකාර ස්වරූපයක් ගන්නා අතර, සෙ.මී. 17.5 ක් පමණ දිගය. ගෙඩි හොඳින් පිරෙන අතර, ඉතා කෙටි කහ පැහැති නටුවක් සහිතය. රවුම් ගෙඩි කහමය කොළ පැහැතිය. සමහර විට පරිනත වන විට විනිවිදමය ස්වරූපයක් ගන්නා අතර, පොත්ත පහසුවෙන් ගැලවේ. ගෙඩියක බීජ 2-3 ක් අඩංගු වේ. පොකුරේ ගෙඩි ඉදීම බොහෝදුරට ඒකාකාරී වේ.

තිරස් පුහුණු කිරීමේ ක්‍රමය සහ ශාකාවකට පර්ව 4-6 ක් සහිතව කප්පාදුව (spur pruning) මෙම ප්‍රභේදය සඳහා භාවිතා කළ හැකිය. කෘෂිකර්ම දෙපාර්තමේන්තු පොහොර නිර්දේශය භාවිතා කළ හැකිය.

*මූලාශ්‍රය: එස්.ජී. පියදාස, පර්යේෂණ නිලධාරී, ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, මහඉලුප්පල්ලම.*

*සංස්කරණය*
**පී. වාසුදේවා**

*පරිවර්තනය*
**ජයන්තා ඉලන්කෝන්**

වැඩිදුර තොරතුරු සඳහා විමසන්න : අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, තැ.පෙ. 18, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.

කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය මඟින් ප්‍රකාශයට පත් කෙරිනි.

# රා.සේ.පි.

මුද්‍රිත ද්‍රව්‍යය

භාර නොදුනහොත් ආපසු යොමු කරන්න:

අධ්‍යක්ෂ,
ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය,
තැ.පෙ. 18,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

මෙම පත්‍රිකාව, පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ පරිගණක අංශයේ පිටු සකස් කර ගන්නොරුව කෘෂිකර්ම මුද්‍රණාලයේ දී මුද්‍රණය කරන ලදී.

පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.
කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය

වෙළුම 6, අංක 3 | 2002 නොවැම්බර් - දෙසැම්බර්

# "රාවණා" නව කුරක්කන් ප්‍රභේදයක්

කුරක්කන් (Eleusine coracana L. Gaerth ) දියවැඩියා රෝගීන් රෝගීන් අතර මෙන්ම දිගු වේලාවක් කය වෙහෙසා වැඩ කරන ගොවිමහතුන් අතරද ඉතා ජනප්‍රිය ධාන්‍යමය ආහාරයකි. එබැවින් කුරක්කන් සඳහා වෙළපොලෙහි හොඳ මිලක් පවතී. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත කුරක්කන් ප්‍රභේද වන එම්අයි 301, එම්අයි 302 හා රවි යන ප්‍රභේද අතරින්, රවි ප්‍රභේදයේ බීජ නිෂ්පාදනය හා බෙදා හැරීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. අඩු අස්වැන්නක් ලබාදීම හා වගා කාලය වැඩි නිසා එම්අයි 301 හා එමඅයි 302 යන කුරක්කන් ප්‍රභේද ගොවීන් අතර ජනපිය නොවිණි.

වැඩි අස්වැන්නක් ලබා දෙන කෙටිකාලීන කුරක්කන් ප්‍රභේදයක අවශ්‍යතාව සපුරාලනු සඳහා ඉන්දියාවෙන් හඳුන්වා දෙන ලද පෙලපත් කීපයක මෙරටට යෝග්‍යතාවය පිළිබඳ පරීක්ෂණ 1992 සිට සිදු කරනු ලදී. PES 110 නම් පෙලපත මෙරටට ඉතා යෝග්‍යබව හඳුනාගත් බැවින්, 2002 ජූනි මාසයේ දී .රාවනා. නමින් නව කුරක්කන් ප්‍රභේදයක් ලෙස ගොවීන්ට වගා කිරීම සඳහා නිර්දේශ කරන ලදී.

වැඩි අස්වැන්නක් ලබා දෙන ප්‍රභේදය වන රාවණා, යල සහ මහ කන්න දෙකෙහිම මෙන්ම උස් හා පහත් බිම් වල වගා කිරීමට සුදුසුය. දැනට නිර්දේශිත රවි නැමැති ප්‍රභේදයට වඩා වැඩි අස්වැන්නක් රාවණා ප්‍රභේදය මගින් ලබා ගත හැකිය. ඇඳවැටීම අඩු රාවණා ප්‍රභේදය වගා කර දින 95-100 පමණ කාලයකදී අස්වැන්න ලබා ගත හැකිය. කොල පාලු රෝගය හා පුරුක්පණු හානියට රවි ප්‍රභේදය හා සමාන මධ්‍යස්ථ ප්‍රතිරෝධීතාවයක් රාවණා ප්‍රභේද ද පෙන්නුම් කරයි.

සෘජු වර්දන විලාසයක් පෙන්වන රාවණා ප්‍රභේද සෙ.මී. 85-90 උසට වර්ධනය වේ. සිටුවා දින 60 කදී පමණ පුෂ්ප හට ගනී. එක කරලක සෙ.මී. 6 ක් පමණ දිග ඇඟිලි 5-8 ක් පමණ ඇත. ඇඟිලි අතු නොබෙදෙන අතර මේරීමේ දී ශුකිකාවන් හැලීයාමක් සිදු නොවේ.

*මූලාශ්‍රය : කේ.එම්. කරුණාරත්න මයා , පර්යේෂණ නිලධාරී,*
*ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය,*
*මහඉලුප්පල්ලම.*

# නව දූරියන් ප්‍රභේදය "කසුන්"

ඉද්ශීය වෙළඳපොලේ හොඳ ඉල්ලුමක් ඇති දූරියන්, ඉතා හොඳ අපනයන විභවයක් ඇති පලතුරකි. විශේෂ ලක්ෂණ හඳුනාගෙන වගාව සඳහා නිර්දේශිත ප්‍රභේද නොමැතිවීම දූරියන් වගාව සම්බන්ධයෙන් පැවති විශාල අඩුපාඩුවක් විය. බීජ මගින් පැල ලබා ගැනීම හා පරපරාගනය සිදුවීම නිසා දූරියන් වගාවේ පැල අතර විශාල වෙනස්කම් රාශියක් දක්නට ලැබේ. මෙයට පිළියමක් ලෙස දූරියන් ශාක විශාල සංඛ්‍යාවක් ගවේෂණය කිරීමෙන් පස් උසස් ගුණාත්මයෙන් යුත් ගෙඩි හටගන්නා ප්‍රභේදයක් හඳුනාගෙන "කසුන්" නමින් 2002 ජූනි මාසයේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් වගාව සඳහා නිර්දේශ කරන ලදී.

මහනුවර ප්‍රදේශයෙන් හඳුනාගන්නා ලද මෙම ප්‍රභේදය වාර්ෂිකව ඵල දරණ අතර, වසරකට ගෙඩි 400 කට වඩා වැඩියෙන් නිපදවයි. පුෂ්ප හට ගැනීම මාර්තු-අප්‍රේල් කාලවලදී සිදුවන අතර ඵලදාව ජූලි, සැප්තැම්බර් කාලවලදී නෙලාගත හැකිය. ගෙඩියක හැඩය අණ්ඩාකාර වන අතර සාමාන්‍ය බර කිලෝ ග්‍රෑම් 1.64 කි. මේරීමේදී කහමය කොළ පැහැතිය. ගෙඩියේ පිටත කටුවේ තියුණු වක් වූ කටු දැකිය හැකි අතර මෙම කටු ගෙඩිය කෙරවර දැකිය නොහැක. ගෙඩියක කුහර 5ක් පමණ ඇති අතර මදුළු 12ක් පමණ පිහිටයි. තැඹිලි කහපාට මදුළු ආකර්ශණීය සුවඳක් හා රසයකින් යුක්ත වන අතර තරමක තද බවින් (වකරා වැනි) යුතු වයනයක් ඇත. ගෙඩියක ආහාරයටගත හැකි කොටස 32% ක් පමණ වෙයි.

කුඤ්ඤ බද්ධය මඟින් දූරියන් ග්‍රාහකයක් මතට බද්ධ කිරීමෙන් මෙම ප්‍රභේදය ප්‍රචාරණය කළ හැක. මහනුවර, මාතලේ, කෑගල්ල, ගම්පහ, කළුතර, රත්නපුර හා බදුල්ල ප්‍රදේශයේ කොටසකට හා මොණරාගල දිස්ත්‍රික්කයෙහි වගා කිරීමට කසුන් ප්‍රභේදය නිර්දේශ කර ඇත.

*මූලාශ්‍රය : එච්.එම්.එස්. හීන්කෙන්ද මයා, පර්යේෂණ නිලධාරී,*
*උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය,*
*ගන්නොරුව, පේරාදෙණිය.*

**ජාතික සෞභාග්‍ය උදෙසා කෘෂිකාර්මික අංශයෙන් විශිෂ්ඨ දියුණුවක් අත්කර ගනිමු**

# "ලංකා බටර්" කහ පැහැති කරල් සහිත වැල් බෝංචි ප්‍රභේදයක්

ඉතා ජනප්‍රිය ජනප්‍රිය එලවළුවක් වන වැල්බෝංචි (*Phaseolus vulgaris*) බදුල්ල, නුවරඑළිය, මහනුවර, මාතලේ සහ රත්නපුර දිස්ත්‍රික්කවල බහුල ලෙස වගා කරති. මුළු බෝංචි නිෂ්පාදනයෙන් 95%ක්ම නිපදවන්නේ මෙම දිස්ත්‍රික්කයන්හිය. මේ අතරින් බදුල්ල දිස්ත්‍රික්කය මුළු බෝංචි නිෂ්පාදනයෙන් 30-40%ක් නිපදවයි. කොළ පැහැති කරල් සහිත කෙන්ටකි වොන්ඩර් ග්‍රීන් (KWG), හා කහ පැහැති කරල් සහිත කෙන්ටකි වොන්ඩර් වැකස් (KWW) නමින් ප්‍රභේද දෙකක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මීට පෙර නිර්දේශ කරන ලදී. බහුලව දැකිය හැකි බෝංචි රෝග වන මලකඩ රෝගය, ඇන්ත්‍රැක්නෝස් රෝගය සහ කෝණාකාර පත්‍ර ලප රෝගයට මෙම ප්‍රභේද දෙක ග්‍රාහිතාවයක් දැක්වූ නිසා ගොවීන් අතර මෙම ප්‍රභේද දෙක ජනප්‍රිය නොවිණි.

මේ නිසා ගොවීන් ඔවුන් විසින්ම තෝරාගත් බෝංචි දර්ශ වගා කරති. ගොවීන් වගා කරන ප්‍රභේද බොහොමයක් මිශ්‍ර ප්‍රභේද නිසා කරල් වල පාට, හැඩය, ප්‍රමාණය හා අස්වැන්නේ වෙනස්කම් රාශියක් දැකිය හැක. මෙම දේශීය වැල්බෝංචි වගා දර්ශ අඛණ්ඩ වරණයත් සිදුකිරීමෙන් වැඩි දියුණු කිරීමේ හැකියාව ඇත.

ගොවීන්ට වගාව සඳහා නිර්දේශ කිරීමට සුදුසු වැල්බෝංචි වගා ප්‍රභේදයක් හඳුනාගෙන, වරණය කිරීම සඳහා බණ්ඩාරවෙල ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය මගින් පර්යේෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. වැලිමඩ ප්‍රදේශයෙන් තෝරාගන්නා ලද කහපැහැති කරල් සහිත වැල්බෝංචි පෙළපත වගාවට ඉතා සුදුසු බව හඳුනාගත් බැවින්, 2002 ජුනි මාසයේදී ගොවීන්ට වගා කිරීම සඳහා "ලංකා බටර්" නමින් මෙම ප්‍රභේදය නිර්දේශ කරන ලදී.

මෙම "ලංකා බටර්" ප්‍රභේදය, ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදබැලීම් (NCVT) සහ ප්‍රභේද අනුවර්තිතා අත්හද බැලීම් (VAT පරීක්ෂණ වලදී PB 2-3 ලෙස නම් කර තිබුණි.

**වගු අංක 1 : බණ්ඩාරවෙල ප්‍රා.කෘ.පර්.හා සං.මධ්‍යස්ථානයේ සිදුකරන ලද ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් පරීක්ෂණ වලදී ලංකා බටර් සහ අනෙකුත් වැල්බෝංචි වරණයන් වල අස්වනු සැසඳීම. (හෙක්ටයාරයකට මෙට්‍රික්ටොන්)**

| ප්‍රභේදය/ පෙළපත | යල 96 | මහ 96/97 | මහ 97/98 | මහ 98/99 | මධ්‍යයනය |
|---|---|---|---|---|---|
| PB 2-3 | 17.6 | 23.9 | 13.9 | 16.4 | 18.0 |
| PB 1-2 | 19.2 | 21.5 | 9.9 | 14.5 | 16.2 |
| PB 8-18 | 13.8 | 24.2 | 11.9 | 16.2 | 16.5 |
| PB 4-8 | 12.7 | 21.05 | 7.8 | 16.6 | 14.5 |
| KWG | 6.3 | 20.85 | 5.7 | 10.1 | 10.7 |

**වගු අංක 2 : ගොවි ක්ෂේත්‍ර වල සිදුකරන ලද ප්‍රභේද අනුවර්තිතා අත්හදා බැලීමේ පරීක්ෂණ වලදී ලබාගත් අස්වනු දත්ත සැසඳීම. (හෙක්ටයාරයකට මෙ.ටො.)**

| ප්‍රභේදය/ පෙළපත | යල 99 | | මහ 99/2000 | | | යල 2000 | | |
|---|---|---|---|---|---|---|---|---|
| | බලංගොඩ | බණ්ඩාරවෙල | බලංගොඩ | වැලිමඩ | මහනුවර | බලංගොඩ | වැලිමඩ | මහනුවර |
| PB 2-3 | 14.1 | 17.4 | 3.7 | 10.6 | 11.4 | 24.7 | 22.3 | 30.3 |
| PB 4-8 | 7.2 | 15.3 | 1.4 | 6.9 | 4.7 | 7.3 | 16.8 | 11.6 |
| PB 8-18 | 7.7 | 18.3 | 2.1 | 7.2 | 5.8 | 8.4 | 17.3 | 14.4 |
| ගොවීනගේ වගා දර්ශ | 10.3 | 15.6 | 1.5 | 7.0 | - | 22.6 | 19.9 | 14.7 |
| K.W.G. | 11.0 | 16.8 | 1.0 | 5.4 | 3.9 | 12.7 | 14.4 | 12.3 |

"ලංකා බටර්" කහපැහැති කරල් සහිත වැල් බෝංචි ප්‍රභේදයකි. පුෂ්ප දම්පැහැතිය. සිටුවා දින 41-47 පමණ දී 50% ක පුෂ්ප පිපෙන අවස්ථාවට පත් වේ. ඉන් දින 16-22 ට පමණ පසුව පළමු අස්වැන්න නෙලා ගත හැකිය. එක් පොකුරක කරල් 3-4 ක් හටගන්නා අතර අස්වනු වාර 7-8 ලබා ගැනීමේ හැකියාව ඇත. කරල හරස්කඩ රවුම්ය. බීජ කළු පැහැතිය. කිලෝ එකක බරක්, කරල් 90 කින් පමණ ලැබේ. ලංකා බටර් ප්‍රභේදයේ විභව අස්වැන්න හෙක්ටයාරයට ටොන් 30 කි.

ලංකා බටර් ප්‍රභේදය මුල් කුණුවීම, ඇන්ත්‍රැක්නෝස් හා මලකඩ රෝග වලට හොඳින් ඔරොත්තු දෙයි.

*මූලාශ්‍රය : ආචාර්ය එච්.එම්. ආරියරත්න මයා, පර්යේෂණ නිලධාරී, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නොරුව.*

# රත්නපුර දිස්ත්‍රික්කය සඳහා 'බලංගොඩ නිල්' බෝංචි ප්‍රභේදය

වැල්බෝංචි, රත්නපුර දිස්ත්‍රික්කයේ, බංලගොඩ ප්‍රදේයේ ඉතා ජනප්‍රිය එළවළුවකි. බලංගොඩ ගොවීන් දේශීය වගා දර්ශ රාශියක් වගා කරනු ලබන අතර ඒවායේ ගතිලක්ෂණ වල හා ලැබෙන අස්වැන්නේ පුළුල් විචලතාවයක් පෙන්නුම් කරයි. එබැවින් බණ්ඩාරවෙල ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය මගින් බලංගොඩ ප්‍රදේශයට සුදුසු වැඩි අස්වැන්නක් ලබා දෙන වැල්බෝංචි ප්‍රභේදයක් තෝරා ගැනීම සඳහා පර්යේෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

බලංගොඩ ප්‍රදේශයෙන් තෝරා ගන්නා ලද වරණයන් අතරින් රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවි ක්ෂේත්‍රවල කරන ලද ප්‍රභේද අනුවර්තිතා අත්හද බැලමේ (VAT) පරීක්ෂණ වලද මේ (BLV-1) වැඩි අස්වැන්නක් ලබා දුනි.

**වගු අංකය 1: 1988 යල ප්‍රභේද අනුවර්තිතා අත්හදා බැලීමේ පරීක්ෂණ වලදී BLV-1 ලබාදුන් අස්වනු දත්ත**

| ප්‍රභේදය | අස්වැන්න(හෙක්ටයාරයට මෙට්‍රික් ටොන්) | |
|---|---|---|
| | බල්ලකැටුව (බදුල්ල) | බලංගොඩ (රත්නපුර) |
| BLV - 1 | 8.4 | 22.2 |
| RBG - 2 | 8.2 | 11.4 |
| RBG - 10 | 7.3 | - |
| ගොවින්ගේ වරණය | - | 7.2 |
| K.W.G | 5.1 | 10.8 |
| LSD (p=0.05) | 1.9 | 1.5 |
| CV% | 27.3 | 27.3 |

**වගු අංක 2 : බලංගොඩ ප්‍රදේශයේ ප්‍රභේද අත්හදා බැලීම් පරීක්ෂණ වලදී BLV- 1 සහ අනෙකුත් ප්‍රභේද/පෙලපත් වල අස්වනු සැසඳීම.**

| ප්‍රභේදය/පෙලපත | යල 1999 | මහ 99/2000 | යල 2000 |
|---|---|---|---|
| Pb 2-3 | 14.1 | 3.1 | 24.7 |
| Pb 4-8 | 7.2 | 1.4 | 7.3 |
| Pb 8-18 | 7.7 | 2.1 | 8.4 |
| ගොවින්ගේ වරණ | 10.3 | 1.5 | 22.6 |
| BLV-1 | 13.2 | 2.7 | 28.6 |
| LSD | - | 0.4 | 78 |
| CV% | - | 31.7 | 17.4 |

BLV-1 කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2002 ජුනි මාසයේදී "බලංගොඩ නිල්" නමින් බලංගොඩ ප්‍රදේශයේ වගා කිරීම සඳහා නිර්දේශ කරන ලදී.

බලංගොඩ නිල් සෙ.මී. 14 පමණ දිගැති රවුම් කොල පැහැති කරල් හටගන්නා වැල් බෝංචි ප්‍රභේදයකි. සිටුවා දින 43 ක් 50% ක පුෂ්ප පිපෙන අවස්ථාවට පත්වන අතර සිටුවා දින 46 පළමු අස්වැන්න නෙලා ගත හැකිය. පොකුරක කරල් 3.4 ක් ඇති අතර එක් කරලක බීජ 7-8 ක් පවතී.

බලංගොඩ නිල් ප්‍රභේදයේ වැලකින් කරල් 21 ක් පමණ ලැබෙන අතර එක් කිලෝ ග්‍රෑමයක් සඳහා කරල් 130 ක් පමණ අවශ්‍යය. ගොවිමහතුන් මෙම ප්‍රභේදය වගා කොට හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 14.2 පමණ ලබා ගන්නා නමුත් මෙහි විභව අස්වැන්න හෙක්ටයාරයට මෙට්‍රික් ටොන් 28 ක් පමණ වේ.

බලංගොඩ නිල් ප්‍රභේදයේ බීජ දුඹුරු පැහැතිය. වකුගඩු හැඩැතිය. බීජ 1000 ක බර ග්‍රෑම් 190 ක් පමණ වේ.

කෙන්ඩර් වොන්ඩර් ග්‍රීන් ප්‍රභේදයට වඩා බලංගොඩ නිල් ප්‍රභේදයට මුල් කුණුවීමේ රෝගයට හා ඇන්ත්‍රැක්නෝස් රෝගයට හොඳින් ඔරොත්තුදීමේ හැකියාවක් ඇත. නිවැරදි පාලන ක්‍රම අනුගමනය කිරීමෙන් බොහෝ කෘමි ආසාදනයන් පාලනය කල හැක.

*මූලාශ්‍රය : ආචාර්ය එච්.එම්. ආරියරත්න මයා, පර්යේෂණ නිලධාරී, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නොරුව.*

# නව මිරිස් ප්‍රභේදයක් 'එම්.අයි.හොට්'

ශ්‍රී ලාංකික ගොවියාට මිරිස් ඉතා වැදගත් මුදල් බෝගයකි. 2001 වර්ෂයේ දී වගා කල භූමි ප්‍රමාණය සාමාන්‍යයෙන් හෙක්ටයාර් 20,000 ක් පමණ වූ අතර වියලි මිරිස් නිෂ්පාදනය මෙ.ටො. 15,000 ක් පමණ විය. දේශීය වියලි මිරිස් අවශ්‍යතාවය වසරකට මෙ.ටො. 4,000 ක් පමණ වේ.

මිරිස් වලින් ලැබෙන අඩු අස්වැන්න වැඩි කිරීමේදී සැලකිය යුතු ප්‍රධාන හේතු අතර වියළි මිරිස් වල ගුණාත්මය අඩු කරන ඇන්ත්‍රැක්නෝස් රෝගය සහ වියලි මිරිස් කල්තබා ගත හැකි කාලය අඩුවීමද මූලික වේ. දැනට නිර්දේශිත ප්‍රභේදයන්හි මෙම ලක්ෂණ අඩුය. මේ තත්වය මඟ හරවා ගැනීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2002 ජුනි මාසයේ දී "එම්.අයි.හොට්" නමින් නව මිරිස් ප්‍රභේදයක් නිර්දේශ කරන ලදී.

"එම්.අයි හොට්" දේශීයව අභිජනනය කල ප්‍රභේදයක් වන අතරඑ ඇන්ත්‍රැක්නෝස් රෝගයට මධ්‍යස්ථ ප්‍රතිරෝධිතාවයක් පෙන්වයි. සර්කස්පෝරා පත්‍ර ලප රෝගයට සහ කොඇනිතෝරා අංගමාර (රිකිලි කුණුවීම) රෝගයට ක්ෂේත්‍රයේදී ඔරොත්තු දීමේ ලක්ෂණ පෙන්නුම් කරයි. වර්ෂා-පෝෂිත තත්වයන්හිදී ඉහල අස්වැන්නක් ලබා දෙන එම්.අයි හොට් ප්‍රභේදය අඩු තෙතමන තත්ව යටතේ දී ද හොඳින් නඩත්තු කළ හැකිය. දැනට නිර්දේශිත ප්‍රභේදයන්ට වඩා වැඩි කාලයක් ගබඩා කර තැබිය හැකි අතර නිපදවනු ලබන වියලි මිරිස් වල ආකර්ශණීය බව වැඩිය. "එම් අයි හොට්" අඩු මිරිස් ලෙස මෙන්ම වියලි මිරිස් නිපදවීමට සඳහා ද එකසේ සුදුසුය.

ගොවි ක්ෂේත්‍ර වල යල හා මහ දෙකන්නයෙහි කරන ලද ප්‍රභේද අනුවර්තිතා අත්හද බැලීමේ පරීක්ෂණ වලදී, වැඩි වියළි මිරිස් නිෂ්පාදනයක් ලබා ගන්නා ලදී.

**වගු අංක 1 : 2001 යල කන්නයේ දී "එම් අයි හොට්" ප්‍රභේදයෙන් ලැබුණු අස්වනු දත්ත - වියලි මිරිස් අස්වැන්න (හෙක්ටයාරට)**

| ස්ථානය | ප්‍රභේදය/පෙලපත | | | | | |
|---|---|---|---|---|---|---|
| | MI හොට්* | DC 9874 | DC 98471 | DC 985-3 | MI 2 | අරුණළු |
| තිස්සමාරාමය | 3254 | 3163 | 2895 | 2942 | 2954 | 2063 |
| මාගම | 2428 | 1954 | 2045 | 1836 | 1855 | 1655 |
| එප්පාවල | 2465 | 3285 | 2938 | 2653 | 2763 | 2222 |
| මලියදිවුල්වැව | 2836 | 2763 | 2992 | 2435 | 2735 | 1925 |
| තඹුත්තේගම | 2245 | 2463 | 1963 | 1862 | 1978 | 1245 |
| බෙල්ලන්කඩවල | 2976 | 2798 | 2245 | 2102 | 2048 | 1543 |
| සේ.සං.අ.ආ.(මහඉලුප්පල්ලම) | 2939 | 1939 | 1932 | 1300 | 1002 | 1043 |
| කිරලෝගම | 1843 | 1745 | 1245 | 1485 | 1675 | 990 |

* අභිජනන පෙලපත ඩීසී 98171

**වගු අංක 2 : 01/02 මහ කන්නයේ ප්‍රභේද අනුවර්තිතා අත්හදාබැලීම් පරීක්ෂණ වලද එච්.අයි. හොට් ලබාදුන් අස්වනු දත්ත.**

| ස්ථානය | ප්‍රභේදය/පෙලපත | | | |
|---|---|---|---|---|
| | MI හොට් | DC 9874 | DC 985-3 | MI 2 |
| තිස්සමහාරාමය | 2245 | 1962 | 1431 | 1563 |
| තඹුත්තේගම | 1945 | 1742 | 1213 | 1432 |
| බෙල්ලන්කඩවල | 1879 | 2080 | 1242 | 1354 |
| කැටියාව | 2142 | 2246 | 1423 | 1839 |
| එප්පාවල | 2040 | 2034 | 1472 | 1488 |

ඒම් අයි හොට් ප්‍රභේදයේ ශාක වියන නොවිහිදී, එකතුව පවතින අතර මධ්‍යස්ථ ලෙස අතු හට ගනී. සුදු පැහැති පුෂ්ප තනි තනිව කක්ෂීයව හට ගනී. කරලක් සෙ.මී. 6.5-7.5 ක් පමණ දිගය. කෙලවර උල්ව පවතී. ඉදෙන විට රතු පැහැතිය. අධික සැරගතියක් ඇත. වියලි මිරිස් කරල්, වර්ණ වෙනස්වීමකින් තොරව මාස 06 ක් පමණ කාලයක් ගබඩා කර තබාගත හැකියි.

එම්අයි හොට්, ඇන්ත්‍රැක්නෝස් රෝගයට මධ්‍යස්ථ ලෙස ප්‍රතිරෝධිතාවයක් පෙන්වයි. එමනිසා නිපදවනු ලබන වියළි මිරිස් වල අඩංගු වන සුදුකරල් සංඛ්‍යාව ඉතාමත්ම අඩුය. එබැවින් නිර්දේශිත අනෙක් මිරිස් ප්‍රභේද වලට වඩා එම්අයි හොට් මිරිස් ප්‍රභේදයට ගොවීන් වැඩි කැමැත්තක් දක්වයි.

*මූලාශ්‍රය : කේ.ඩී.ඒ. පෙරේරා මෙනවිය, අතිරේක අධ්‍යක්ෂ*
*පලතුරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය,*
*හොරණ.*

**සංස්කරණය**
**ජයන්තා ඉලන්කෝන්**

**කෘෂි - තාක්ෂණ ....... ලුහුඬින්**

කාලීන තාක්ෂණික තොරතුරු සංක්ෂිප්තව තාක්ෂණවේදීන්, විශේෂයෙන්ම ව්‍යාප්ති නිලධාරීන් වෙත ලබාදීමේ අරමුණ උදෙසා කෘෂි - තාක්ෂණ පත්‍රිකාව ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය විසින් වරින් වර නිකුත් කරනු ලැබේ. මෙම පත්‍රිකාවේ අඩංගු තොරතුරු බොහොමයක්ම ප්‍රභවය වී ඇත්තේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ ආයතන සහ මධ්‍යස්ථාන වලිනි. තවද, වෙනත් ඕනෑම මූලාශ්‍රයකින් උපුටා ගත හැකිවූද, ක්ෂේත්‍රයේ ප්‍රායෝගිකව යොදාගත හැකිවූද, තොරතුරු වේ නම්, එවැනි දෑ ද කෘෂි - තාක්ෂණ පත්‍රිකාවෙහි අන්තර්ගත වනු ඇත.

*- සංස්කාරක -*

වැඩිදුර තොරතුරු සඳහා විමසන්න : අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, තැ.පෙ. 18, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය මගින් ප්‍රකාශයට පත් කෙරිනි.

# රා.සේ.පි.

මුද්‍රිත ද්‍රව්‍යය
භාර නොදුනහොත් ආපසු යොමු කරන්න:

අධ්‍යක්ෂ,
ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය,
තැ.පෙ. 18,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

මෙම පත්‍රිකාව, පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ පරිගණක අංශයේ පිටු සකස් කර ගන්නොරුව කෘෂිකර්ම මුද්‍රණාලයේ දී මුද්‍රණය කරන ලදී.

පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.
කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය

වෙළුම 6, අංක 4 | 2003 ජනවාරි - පෙබරවාරි

# "ආසිරි" නව වැටකොළු ප්‍රභේදයක්

පහත රට හා මැදරට තෙත් කලාපීය ප්‍රදේශ වල වගා කරන ඉතා ජනප්‍රිය එළවළුවකි වැටකොළු. දිගැටි ගෙලක් සහිත LA 33 නැමැති වැටකොළු ප්‍රභේදය මීට කළකට ඉහතදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කරන ලදී. එබැවින් වඩා හොඳ වැටකොළු ප්‍රභේදයක අවශ්‍යතාවය දිගු කලක සිට පැවතුණි.

2002 ජූනි මාසයේදී ආසිරි නමින් නව වැටකොළු ප්‍රභේදයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිදහස් කරන ලදී. මෙය කෙටි ගෙලක් සහිත සෙ.මී. 31 පමණ දිග මධ්‍යම ප්‍රමාණයේ වැටකොළු කරල් නිපදවයි. තෙත් කලාපීය ප්‍රදේශවල කරන ලද ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීමේ (NCVT) පරීක්ෂණ වලදී LA 33 ප්‍රභේදය, ආසිරි ප්‍රභේදයට වඩා වැඩි අස්වැන්නක් ලබාදුන්නද, LA 33 ප්‍රභේදයට වඩා හොඳ උපයෝගිතාවයක් ආසිරි ප්‍රභේදය පෙන්නුම් කරන ලදී. ආසිරි ප්‍රභේදය පැලැටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ ජාන එකතුවෙන් ලබා ගන්නා ලද දේශීය වර්ණයකි.

**වගු අංකඃ 1 ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීමේ පරීක්ෂණ වලදී ආසිරි හා LA 33 ප්‍රභේද පෙන්නුම් කරන ලද අස්වනු සාරාංශ හා උපයෝගිතා අංකයන්.**

| ප්‍රභේදය | සාමාන්‍ය අස්වැන්න (හෙක්/ටොන්) | | | උපයෝගිතා |
|---|---|---|---|---|
| | මහ | යල | මධ්‍යයනය | අංකය |
| ආසිරි | 6.12 | 9.70 | 7.91 | 3 |
| LA 33 | 6.92 | 0.42 | 8.17 | 4 |

පහත රට තෙත් කලාපයේ සහ මැදරට තෙත් කලාපයේ ගොවි ක්ෂේත්‍රවල යල මහ දෙකන්නයෙහිම කරනු ලැබූ ප්‍රභේද උපයෝගිතා අත්හදා බැලීමේ (VAT) පරීක්ෂණ වලදී ආසිරි ප්‍රභේද වැඩි අස්වැන්නක් සහ වඩා හොඳ උපයෝගිතාවයක් පෙන්නුම් කරන ලදී.

**වගු අංකඃ 2 ගොවි ක්ෂේත්‍ර වල සිදු කරනු ලැබූ ප්‍රභේද උපයෝගිතා අත්හදා බැලීමේ පරීක්ෂණ වල ලැබුණු අස්වනු සාරාංශ හා උපයෝගිතා අංකයන්.**

| ප්‍රභේදය | සාමාන්‍ය අස්වැන්න (හෙක්/ටොන්) | | | උපයෝගිතා |
|---|---|---|---|---|
| | මහ | යල | මධ්‍යයනය | අංකය |
| ආසිරි | 9.11 | 10.95 | 10.03 | 2 |
| LA 33 | 5.32 | 7.08 | 6.20 | 4 |

LA 33 හා අනෙකුත් පරීක්ෂා කරන ලද පෙළපත් සමඟ සැසඳීමේදී ගොවීන් මෙන්ම පාරිභෝගිකයින් ද ආසිරි ප්‍රභේදයට වැඩි කැමැත්තක් දක්වන ලදී. LA 33 සමඟ සැසඳීමේදී වැඩි බ්‍රික්ස් අගයක් සහ අඩු ජල ප්‍රමාණයක් ආසිරි ප්‍රභේදයේ පැවතුණි. එසේම LA 33 ප්‍රභේදයට සාපේක්ෂව වැඩි වියළි ද්‍රව්‍ය ප්‍රමාණයක්, කෑමට වැඩි රුචිකත්වයක් මෙන්ම පිසීමට ගතවන කාලයද ආසිරි ප්‍රභේදයේ අඩු බවක් පෙන්නුම් කරයි.

කොළ පැහැති පත්‍ර තරමක් බෙදී ඇති අතර මධ්‍යස්ථ ප්‍රමාණයට රෝම පිහිටයි. ඒකගෘහි ශාකයක පුෂ්ප පිපීමේ විලාශයක් පෙන්වන අතර සිටුවීමෙන් දින 38 ක පමණ කාලයකදී 50% ක පුං පුෂ්ප පිපෙන අවස්ථාවට ද, දින 45 ක් පමණ කාලයකදී 50% ජායා පුෂ්ප පිපෙන අවස්ථාවට ද, පත්වේ. සිටුවීමෙන් දින 52 ක පමණ කාලයකදී එළවළුවක් ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා අස්වැන්න නෙලාගත හැක. සිටුවීම සඳහා බීජ ලබා ගැනීමට දින 90 ක් පමණ කාලයකදී කරල් නෙලා ගත හැක. පුෂ්ප පිපීම කලින් සිදුවනවා මෙන්ම ආසිරි ප්‍රභේදයට දින 43 ක් පමණ වන දිගු අස්වනු ලබාගත හැකි කාලයක් ද පවතී.

එළවළුවක් සඳහා අස්වනු නෙලන අවස්ථාවේදී කොළ පැහැති (138 A-B), ආයත හැඩැති වැටකොළු කරලේ ගැඹුරු දාර 10 ක් පිහිටයි. පරිනත අවස්ථාවේදී කරලේ දිග සෙ.මී. 31 පමණ වන අතර කරලේ උපරිම විශ්කම්භය සෙ.මී. 7.7 කි. කරලේ මතුපිට පෘෂ්ඨය අධික රැළි ගතියක් පෙන්නුම් කරයි. කරලක බර ග්‍රෑම් 280 ක් පමණ වේ. කරලේ මදය කොළමය සුදු පැහැතිය. (157 B) නටන ජලයේ විනාඩි 4 ක කාලයකින් උයා ගැනීමේ හැකියාව ඇත.

මේරූ බීජ කළු පැහැතිය. කරලක බීජ 150 ක් පමණ ඇත. බීජ ග්‍රෑම් 100 ක බර ග්‍රෑම් 10.6 කි.

කොඇනිනෝරා දිලීරය මඟින් ඇති කරන පුෂ්ප අංගමාරය සහ නොමේරූ ඵල කුණුවීමේ රෝගී තත්වයන්ට සහ සුඩොපෙරනොස්පෝරා දිලීර විශේෂ මඟින් ඇති කරන යටිපුස් රෝගයට ද LA 33 ට සාපේක්ෂව ආසිරි ප්‍රභේදය සතුව හොඳ ප්‍රතිරෝධීතාවයක් පවතී.

*මූලාශ්‍රය: ඩී.පී.එස්.රත්නපාල මිය, පර්යේෂණ නිලධාරිනී*
*ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය*
*බොඹුවෙල.*

# අර්ධ ලෙස සැකසූ මුකුණුවැන්න

ශ්‍රී ලාංකිකයින් අතර මුකුණුවැන්න ජනප්‍රිය කොළ එළවළුවකි. එමඟින් ආහාරයට විටමින්, යකඩ හා තන්තු සපයා දෙයි. වෙළඳපොලෙන් මිලදී ගන්නා මුකුණුවැන්න ආහාරයට ගැනීමට පෙර මේරූ සහ අනවශ්‍ය කොටස් ඉවත් කර හොඳින් සෝදා පිරිසිදු කරගත යුතුය. වැඩි කාලයක් වැය වන මෙම ක්‍රියාවලිය, කාර්ය බහුල ගෘහණියන් විසින් පිළියෙල කරන දෛනික ආහාර සලාකයට මුකුණුවැන්න එක්කර ගැනීමට ඇති අවස්ථාව මඟ හැරවීමට හේතුවී ඇත. පිසීමට සකස් කළ ආකාරයට මුකුණුවැන්න ලබා ගැනීමට සැලැස්විය හැකි නම් මුකුණුවැන්න ආහාරයට එක්කර ගැනීම මීට වඩා දිරිමත් කළ හැක.

එළවළුවක්, පිසීමට සකස් කළ ආකාරයට පිළියෙල කිරීම "අර්ධ ලෙස සැකසීම" ලෙස හඳුන්වයි. අර්ධ ලෙස සැකසූ ආහාර වල ඉහල ශ්වසන වේගයක් ඇති අතර ඒවා ක්ෂුද්‍රජීවී මඟින් නරක්වීමට දක්වන පාත්‍රිතාවය ද වැඩිය. අර්ධ ලෙස සැකසූ ආහාරයක ජීවිත කාලය වැඩිකර ගැනීමට පූර්වෝපායන් යෙදිය යුතු අතර ක්ෂුද්‍රජීවීන් ගෙන් ආරක්ෂා කර ගැනීම ද කල යුතුය.

මුකුණුවැන්න සිහින් කොටස් වලට කැපීමේදී පිටවන සෛල යුෂ සහ සෛල යුෂ මත ක්ෂුද්‍රජීවීන් ඉතා වේගයෙන් ගුණනය වීම හේතුවෙන් දුඹුරු පැහැති අවර්ණ වීමක් සිදුවේ. එම නිසා අර්ධ ලෙස සකසන ලද මුකුණුවැන්න වල ජීවිත කාලය වැඩිකර ගැනීමට සහ ක්ෂුද්‍රජීවීන්ගෙන් ආරක්ෂා කර ගැනීමට ආරක්ෂක ක්‍රියා මාර්ගයක් අනුගමනය කළ යුතුය.

මුකුණුවැන්න අර්ධ ලෙස සැකසීමේ නව තාක්ෂණික ක්‍රමයක් ගන්නෝරුව ආහාර පර්යේෂණ ඒකකය විසින් සංවර්ධනය කර ඇත.

එම ක්‍රියාවලිය පහත ආකාර වේ.

- වෙළඳපොලෙන් මිලදී ගන්නා ලද මුකුණුවැන්න වලින් ආහාරයට ගත හැකි කොටස වෙන්කර ගැනීම.
- ගලායන කරාම ජලයෙන් සේදීම
- උෂ්ණත්වය සෙ.ග්‍රේ. $8^0$ ක් පමණ වූ 100 ppm ක්ලෝරීන් ජලයේ ගිල්වීම.
- ක්ලෝරීන් ඉවත්වන තුරු ශීතල ජලයෙන් සෝදා පිරිසිදු කිරීම.
- ජලය ඉවත් වී යාමට තැබීම.
- ප්‍රතිකාර කරන ලද මුකුණුවැන්න වල නොබැඳෙන වානේ පිහියකින් සිහින්ව කැපීම.
- සෙ.මී. 19×14 ප්‍රමාණයේ ගේජ් 150 පොලිප්‍රොපිලීන් බෑගයක සිහින්ව කපන ලද මුකුණුවැන්න ග්‍රෑම් 100 ක් අසුරා වායුරෝධක වන සේ හොඳින් සීල් කිරීම.

මෙම පැකට් සෙ.ග්‍රේ. $8^0$ උෂ්ණත්වයේ ඇති ශීතකරණයක දින 07 ක් ගබඩා කර තැබිය හැක.

ප්‍රතිකාර නොකර සිහින්ව කපා සෙ.ග්‍රේ. $8^0$ උෂ්ණක්වයේ තබන ලද මුකුණුවැන්න වලට වඩා ප්‍රතිකාර කර අර්ධ ලෙස සැකසූ මුකුණුවැන්න වල දුඹුරු පැහැ අවර්ණ වීම ඉතා අඩුය. එබැවින් අර්ධ ලෙස සැකසූ මුකුණුවැන්න වල ජීවිත කාලය වැඩිකර ගැනීම 1% සිට්‍රික් අම්ල ප්‍රතිකාරය කිරීම ඉතා අවශ්‍යය. අප ආහාරයට ගන්නා පලතුරු හා එළවළු බොහෝමයකට ස්වභාවිකව සිට්‍රික් අම්ලය අඩංගුව ඇති නිසා, සිට්‍රික් අම්ලය ආහාරයක එක්වීම හානිදායක නොවේ.

උෂ්ණත්වය සෙ.ග්‍රේ. $8^0$ ක පවතින ශීතකරණයක ගබඩා කිරීමෙන් දින 07 ක් පමණ කාලයක් ක්ෂුද්‍ර ජීවී හානි වලින් තොරව තබා ගත හැක. අර්ධ ලෙස සැකසූ මුකුණුවැන්න ග්‍රෑම් එකක සිටින ක්ෂුද්‍ර ජීවී සංඛ්‍යාව හානිකර මට්ටමට වඩා බොහෝ සේ අඩු බැවින් මෙම තාක්ෂණයේ සකසන ලද මුකුණුවැන්න ආහාරයට ගැනීම ආරක්ෂාකාරිය.

ශීතකරණ පහසුකම් සහිත සුපිරි වෙළඳසැල් හෝ ඕනෑම වෙළඳ සැලකදී මෙසේ අර්ධ ලෙස සැකසූ මුකුණුවැන්න ඉහල මිලකට අලෙවිකර ගැනීමේ හැකියාවක් ඇත. මෙය කාර්ය බහුල පුද්ගලයින් සඳහා පහසු නිෂ්පාදනයකි. මේ පිළිබඳ උනන්දුවක් දක්වන ඕනෑම අයෙකුට මෙය පහසු ස්වයං රැකියා අවස්ථාවක් බවට පත්කර ගත හැක.

1% සිට්‍රික් අම්ල ද්‍රාවණයට ආදේශකයක් ලෙස 20 ppm පොටෑසියම් මෙටා බයි සල්ෆයිට් (KMS) යොදා ගත හැකි නමුත් මෙය සමහර පුද්ගලයින් සඳහා ආසාත්මිකතා ඇති කරයි. එබැවින් මුකුණුවැන්න ප්‍රතිකාර කිරීම සඳහා 1% සිට්‍රික් අම්ල ද්‍රාවණය නිර්දේශ කරයි.

*මූලාශ්‍රය: ආචාර්ය: කේ.එච්.සාරානන්ද, පර්යේෂණ නිලධාරී*
*ආහාර පර්යේෂණ ඒකකය, ගන්නෝරුව.*

# මහඉලුප්පල්ලමෙන් දෙමුහුන් බඩඉරිඟු ප්‍රභේද

රළු ධාන්‍ය බෝග වල අභිජනන වැඩ සටහන, මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් සිදුකරන වැදගත් පර්යේෂණ වැඩ සටහනකි. ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල වගා කරන ඉතා වැදගත්, ජනප්‍රිය බෝගයක් වන බඩඉරිඟු මෙම වැඩ සටහනෙහි ප්‍රධාන ස්ථානයක් හිමිකර ගෙන ඇත.

1998 සිට තනි මුහුම් ක්‍රමයට ලබාගත් බඩඉරිඟු දෙමුහුම් (Single Cross Maize Hybrids) 300 කට වැඩි සංඛ්‍යාවක් වැඩි දියුණු කර ඇගයීම මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් සිදුකර ඇත. මුල් අවධියේදී මැක්සිකෝවේ ජාත්‍යන්තර තිරිඟු හා බඩඉරිඟු වැඩි දියුණු කිරීමේ මධ්‍යස්ථානයෙන් ලබා ගන්නා ලද මව් පෙළපත් වලින් තනි මුහුම් (single crosses) 164 ක්, නියං ප්‍රතිරෝධීතාවය, ඉහල ගුණාත්මයෙන් යුත් ප්‍රෝටීන (ලයිසින් හා ට්‍රිප්ටොපෑන් වැඩි) රෝග ප්‍රතිරෝධීතාව වැනි විශේෂිත ගුණාංග හා වැඩි අස්වනු ලබාදීම වැනි කරුණු සලකා වැඩි දියුණු කරන ලදි. පසුගිය වසර 4 ක කාලය තුල කරන ලද ඇගයීමේ වැඩ සටහන් වලින් බලාපොරොත්තු තැබිය හැකි දෙමුහුම් කීපයක් හඳුනාගෙන ඇත.

වාණිජ දෙමුහුම් හා සමාන අස්වැන්නක් ලබාදෙන, නියං ප්‍රතිරෝධීතාවයක් පෙන්වන පාරිශුද්ධ පෙළපත් සහිත දෙමුහුම් 03 ක් මේ අතර ඇත. මෙම දෙමුහුම් වල බීජ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් කුණ්ඩසාලේ බීජ ගොවිපලේ 2001/2002 මහ කන්නයේ සිට නිපදවීම කරයි. මෙම දෙමුහුම් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවීන්ගේ ක්ෂේත්‍ර වලදී වැඩිදුරට ඇගයීමකට ලක්කරන ලදී. මෙම බීජ වලින් කොටසක් සුළු මිලකට, අනුරාධපුර ගොවීන්ට අලෙවි කරන ලදි.

මෙයට අමතරව ගුණාත්මක ප්‍රෝටීන් වලින් සමන්විත බඩඉරිඟු (Quality Protein Maize - QPM) දෙමුහුම් 21 සංවර්ධනය කර ඇත. මෙයින් මුහුම් කිහිපයක ඉහළ අස්වැන්නක් සහ ධාන්‍ය කණිකා වල ගුණාත්මය හොඳ බව හඳුනාගෙන ඇත. සාමාන්‍ය බඩඉරිඟු සමඟ සැසඳීමේදී ගුණාත්මක ප්‍රෝටීන් සහිත බඩඉරිඟු කුඩා ළමුන්ගේ සහ ගොවිපල සතුන්ගේ බර වැඩිවීම කෙරෙහි වඩා කාර්යක්ෂමව බලපාන බව සොයා ගෙන ඇත. එබැවින් අනාගතයේදී සාමාන්‍ය බඩඉරිඟු වෙනුවට ගුණාත්මක ප්‍රෝටීන් අඩංගු බඩඉරිඟු පාරිභෝජනය වැඩි කිරීමට පියවර ගත යුතුව ඇත.

*මූලාශ්‍රය: කේ.එම්.කරුණාරත්න මයා, පර්යේෂණ නිලධාරී*
*ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය*
*මහඉලුප්පල්ලම.*

# වට්ටක්කා ජෑම්

ශ්‍රී ලංකාවේ ඉතා විශාල ලෙස වගා කරන වට්ටක්කා බෝගයට අස්වනු නෙලන කාලයේදී ලැබෙන්නේ ඉතා අඩු මිලකි. එබැවින් වගා කරුවන්ට තම නිෂ්පාදන වලට ලැබෙනුයේ ඉතා අඩු මිලකි.

ආහාර ජීර්ණයේදී විටමින් "ඒ" බවට පරිවර්තනය වන "බීටා" කැරොටින් (B කැරොටින්) ලබා දෙන හොඳ ප්‍රභවයක් ලෙස වට්ටක්කා සැලකිය හැක. වට්ටක්කා ග්‍රෑම් 100 කින් විටමින් "ඒ" ග්‍රෑම් 0.9 ලබා දෙයි.

වට්ටක්කා ප්‍රධානතම එළවළුවක් ලෙස ප්‍රයෝජනයට ගනී. ආහාර පර්යේෂණ ඒකකය මඟින් සිදුකරන ලද පර්යේෂණ වල ප්‍රතිඵලයක් ලෙස වට්ටක්කා වලින් සාර්ථක ලෙස ජෑම් නිෂ්පාදනය කළ හැකි බව සොයා ගන්නා ලදි. මෙම අමතර භාවිතය නිසා වට්ටක්කා වැවිලිකරුවන්ට තම නිෂ්පාදන සඳහා ඉහළ මිලක් ලැබීමේ අවස්ථාවක් උදාවිය හැක. පළතුරු හිඟ කාලවලදී ජෑම් සෑදීමට ආදේශකයක් ලෙස වට්ටක්කා යොදා ගැනීමට ද හැකියාව ඇත.

අවශ්‍ය ද්‍රව්‍ය:

| | | |
|---|---|---|
| වට්ටක්කා පල්පය | කි.ග්‍රෑම් | 01 |
| සීනි | කි.ග්‍රෑම් | 01 |
| සිට්‍රික් අම්ලය හෝ දෙහි යුෂ | ග්‍රෑම් | 1.5 - 2.0 |
| පෙක්ටින් | ග්‍රෑම් | 10 |
| අනුමත රසකාරක සහ වර්ණක | | |

සාදන ක්‍රමය:

හොඳින් මේරූ වට්ටක්කා ගෙඩි තෝරා, හොඳින් සෝදා පිරිසිදුකර පිට පොත්ත සහ ඇට ඉවත් කරන්න. කුඩා කොටස් වලට කපා භාජනයකට දමා, කැලි යම්තම් වැසෙන සේ ජලය එකතු කර මෘදු වනතුරු තම්බා ගන්න. ජලය පෙරා, මෘදු ලෙස තම්බන ලද වට්ටක්කා කැලි බ්ලෙන්ඩරයක හෝ පල්පරයක ආධාරයෙන් පොඩිකර, පෙරා තන්තුමය කොටස් ඉවත් කර පල්පය සාදා ගන්න.

මෙම පල්පයට සීනි හා සිට්‍රික් අම්ලය දී ඇති ප්‍රමාණයට එකතුකර හොඳින් හැඳි ගාමින් උයන්න. තරමක් උකුවන විට සීනි ස්වල්පයක් සමඟ අඹරාගත් පෙක්ටින් එයට එකතු කරන්න. ජෑම් වල නියම පදම එනවිට රසකාරක හා වර්ණක එකතු කරන්න.

ජෑම් වල කල්තබා ගැනීමේ කාලය වැඩි කිරීම සඳහා වට්ටක්කා ජෑම් කිලෝ ග්‍රෑම් එකකට සෝඩියම් මෙටා බයි සල්ෆයිට් මිලි ග්‍රෑම් 40 ක් එකතු කර හොඳින් මිශ්‍ර කරන්න.

පිළියෙල කරන ලද ජෑම්, විෂබීජ නාශනය කරන ලද බෝතල් හෝ ප්ලාස්ටික් බඳුන් වලට පුරවා සීල් කරන්න. ජෑම් අසුරන ලද බඳුන් සිසිල් වියලි ස්ථානයක විකුණන තුරු හෝ ප්‍රයෝජනයට ගන්නා තෙක් තබන්න.

*මූලාශ්‍රය: සී.කේ.රණවන, පර්යේෂණ සහකාර*
*ආහාර පර්යේෂණ ඒකකය*
*ගන්නෝරුව*

# තක්කාලිවල අග කුණුවීම

මෙම රෝගී තත්ත්වය ආරම්භක අවස්ථාවේ දී ඵල මත සුදු හෝ දුඹුරු පැහැති තිතක් ලෙස ඇති වී, ක්‍රමයෙන් විශාල වී ආසාදිත පටක වියළී යන අතර තද දුඹුරු පැහැයට හැරේ. පසුව මෙය හොඳින් හඳුනාගත හැකි, ගිලුණු, සමක් වැනි පැල්ලමක් බවට පත් වේ. මෙම තත්ත්වය ඵලයේ අග කෙලවර දැකිය හැකි බැවින්, ඵල අග කුණුවීම ලෙස හඳුන්වයි.

ප්‍රමාණවත් ලෙස කැල්සියම් නොලැබීම මෙම තත්ත්වයට හේතු වේ. කැල්සියම්, සෛලවල සෛල බිත්ති ගොඩනැංවීමට අවශ්‍යවන කැල්සියම් පෙක්ටේට් වල සංඝටකයකි. එමනිසා තක්කාලි ගෙඩි විශාල වීමට බලපාන වැදගත් මූලද්‍රව්‍යයක් ලෙස කැල්සියම් ක්‍රියා කරයි.

තක්කාලි ගෙඩි වල වර්ධන වේගය, තක්කාලි ප්‍රභේදය නැතහොත් ජාන සංයුතිය සහ උෂ්ණත්වය, ආර්ද්‍රතාවය වැනි පාරිසරික සාධක මත රඳා පවතී. එබැවින් තක්කාලි ගෙඩි වල වර්ධනය සඳහා ප්‍රමාණවත් ලෙස කැල්සියම් සැපයීම කල යුතුය.

තක්කාලි ශාකයට ප්‍රමාණවත් ලෙස කැල්සියම් නොලැබීයාමට හේතු ලෙස පසේ අඩු මට්ටමින් කැල්සියම් පැවැතීම, අහිතකර පාංශු තත්ත්වයන් හේතුවෙන් තක්කාලි ශාකයට පසේ ඇති කැල්සියම් අවශෝෂණය කරගත නොහැකිවීම සහ ජල හිඟතාවය දැක්විය හැක. ශ්‍රී ලංකාවේ තක්කාලි වල අග කුණුවීමේ තත්ත්වයට බොහෝ විට හේතුවන්නේ ජල හිඟතාවයයි. පසේ ලවණතාවය, කැල්සියම් අවශෝෂණය අවහිර කරන බැවින් ඵල අගකුණුවීමට පසේ ලවණතාවය ද හේතු වෙයි. තක්කාලි වල ඵල අග කුණුවීමේ තත්ත්වය දිලීර රෝගයක් බව ගොවීන් බොහෝවිට විශ්වාස කරන අතර, මෙම තත්ත්වය දුටු විට ප්‍රතිකාර ලෙස දිලීර නාශක යෙදීමට පුරුදුව සිටිති. එබැවින් ගොවීන්ට නිවැරදි ලෙස තක්කාලි ඵල අග කුණුවීමේ තත්ත්වය හඳුනා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදිය යුතුය.

*මූලාශ්‍රය : එම්.ඒ. පාලමකුඹුර මහතා, පර්යේෂණ නිලධාරී*
*උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය*
*ගන්නොරුව*

# උද්‍යාන බෝග නලස්ථ රෝපණය සඳහා අඩු වියදම් සනීකාරකයක්

පැල සීග්‍රව ගුණනය කිරීම සඳහා පටක රෝපණ තාක්ෂණය පුළුල් ලෙස යොදා ගනී. මෙහිදී මූලික අවස්ථාවේ දී ශාක පටක රෝපණය සඳහා M.S. වර්ධන මාධ්‍ය (මුරෂිගේ සහ ස්කූග්) භාවිතා කරන අතර එහි සනිකාරක අන්තර්ගත වී ඇත. සනිකාරක පටක දරා සිටීමට හා මුල් නියමාකාරයෙන් සංස්ථාපනය සඳහා උදව් කරයි.

පටක රෝපණ ක්‍රමයේ දී දැනට භාවිතා කරනු ලබන්නේ සීමිත සනිකාරක ප්‍රමාණයකි. ඒවා නම් ඒගාර්, තිරිඟු පිටි, කිතුල් පිෂ්ඨ නිස්සාරකය, ජෙට්න් සහ ජෙලරයිට් වේ. මේ අතරින් සුලභව භාවිතා කරන සනිකාරකය ඒගාර්ය. අඟුණකොලපැලැස්ස මාග බෝග හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් සිදුකරන ලද පර්යේෂණ වලට අනුව ඒගාර් වලට ඉතා හොඳ ආදේශකයක් වශයෙන් මිලෙන් අඩු සව් වර්ගයක් (Sago)

යොදා ගත හැකි බව සොයා ගෙන ඇත. මෙම සව් (Sago) ඇල්බට් පාම් (Rumph's caryota) ශාකයේ කඳෙන් නිස්සාරණය කරගත් පිටි වර්ගයකි.

එහි දී පුලතිසි කෙසෙල් ප්‍රභේදය සහ ඩෙන්ඩ්‍රොබියම් ඕකිඩ් වල පටක රෝපණයේ දී මාධ්‍ය ඝනීකාරක ලෙස ඒගාර් සහ මෙම සව් වර්ගය යොදා පර්යේෂණ සිදු කරන ලදී. ඝනීකාරකය ලෙස සව් අඩංගු මාධ්‍ය සැකසීමේ දී, MS මාධ්‍ය ලීටරයකට, සව් ග්‍රෑම් 75 ක්ද, ඒගාර් ඝනීකාරකය ලෙස යෙදූ මාධ්‍ය සඳහා M.S. මාධ්‍ය ලීටරයකට, ඒගාර් ග්‍රෑම් 08 ක් ද, මාධ්‍ය නමන අවස්ථාවේ දී එකතු කර මාධ්‍ය සැකසීම සිදු කරන ලදී. කෙසෙල් සඳහා යොදා ගත් පටක රෝපණ මාධ්‍යයන්ට NAA, BAP, හා IAA යන ඔක්සින එකතු කරන ලදී. ඩෙන්ඩ්‍රොබියම් සඳහා යොදා ගත් පටක රෝපණ මාධ්‍යයන්ට ඔක්සින වර්ග කිසිවක් එකතු නොකරන ලදී.

ඒගාර් සහ සව් යන ඝනීකාරක අඩංගු මාධ්‍ය දෙකෙහිම කෙසෙල් හා ඕකිඩ් පැල (plantlets) ඉතා සාර්ථක ලෙස වර්ධනය විය. (1 සහ 2 රූප) සම්මත පත්‍ර වර්ණ සටහනට අනුව ඒගාර් මාධ්‍යයේ වර්ධනය වූ ඕකිඩ් පැල වල පත්‍ර වර්ණයට වඩා (වර්ණ සටහන B - රීදිමය) සව් මාධ්‍යයේ වර්ධනය වූ ඕකිඩ් වල පත්‍ර



වර්ණය (වර්ණ සටහන b - තද කොළ) කොළ පැහැයෙන් වැඩි විය. මීට අමතරව වැඩිදුර ගුණනය සඳහා පැල මාරු කරන කාලයට වා වැඩි කාලයක් සව් අන්තර්ගත මාධ්‍යයේ කෙසෙල් හා ඕකිඩ් දෙවර්ගයේම පැල තබා ගත හැකි බව නිරීක්ෂණය කරන ලදී. ඒගාර් වල නොමැති ඛනිජද්‍රව්‍ය සව් වල පැවතීම මෙයට හේතුවිය හැක.



කෙසෙල් හා ඕකිඩ් නලස්ථ රෝපණයේ දී මාධ්‍ය ඝනීකරණය සඳහා ඉතා සාර්ථක ලෙස සව් කණිකා යොදා ගත හැකිය. සව් ග්‍රෑම් 100 ක් රු. 8.00 ක් මිල වන අතර ඊට සමාන ඒගාර් ප්‍රමාණයක් සඳහා රු. 1500/= - 2000/= මිලක් ද වැය වේ. තවදුරටත් ගුණනය සිදු නොකරයි නම් ඒක උපලයකට ඝනීකාරක සඳහා සව් යොදා ගත් විට රු. 0.16 ක් සහ ඒගාර් යොදා ගත් විට රු. 1.92 ක මුදලක් ද වැය වේ. එබැවින් නලස්ථ රෝපණයේ දී ඒගාර් වලට සමාන ගුණාංගයෙන් යුත්, මිලෙන් අඩු ඝනීකාරකයක් ලෙස සව් යොදා ගත හැක.

*මූලාශ්‍රය : අයි.එම්.එච්.එන්. ප්‍රසාද් පර්යේෂණ සහකාර*
*මාෂ බෝග හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය,*
*අඟුණකොළපැලැස්ස*

**කෘෂි - තාක්ෂණ ....... ලුහුඬින්**

කාලීන තාක්ෂණික තොරතුරු සංක්ෂිප්තව තාක්ෂණවේදීන්, විශේෂයෙන්ම ව්‍යාප්ති නිලධාරීන් වෙත ලබාදීමේ අරමුණ උදෙසා කෘෂි - තාක්ෂණ පත්‍රිකාව ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය විසින් වරින් වර නිතුත් කරනු ලැබේ. මෙම පත්‍රිකාවේ අඩංගු තොරතුරු බොහොමයක්ම ප්‍රභවය වී ඇත්තේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ ආයතන සහ මධ්‍යස්ථාන වලිනි. තවද, වෙනත් ඕනෑම මූලාශ්‍රයකින් උපුටා ගත හැකිවූද, ක්ෂේත්‍රයේ ප්‍රායෝගිකව යොදාගත හැකිවූද, තොරතුරු වේ නම්, එවැනි දෑ ද කෘෂි - තාක්ෂණ පත්‍රිකාවෙහි අන්තර්ගත වනු ඇත.

*- සංස්කාරක -*

*සංස්කරණය*
**ජයන්තා ඉලන්කෝන්**

වැඩිදුර තොරතුරු සඳහා විමසන්න : අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, තැ.පෙ. 18, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය මගින් ප්‍රකාශයට පත් කෙරිනි.

# රා.සේ.පි.

**මුද්‍රිත ද්‍රව්‍යය**
**භාර නොදුනහොත් ආපසු යොමු කරන්න:**

**අධ්‍යක්ෂ,**
**ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය,**
**තැ.පෙ. 18,**
**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,**
**පේරාදෙණිය.**

මෙම පත්‍රිකාව, පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ පරිගණක අංශයේ පිටු සකස් කර ගන්නොරුව කෘෂිකර්ම මුද්‍රණාලයේ දී මුද්‍රණය කරන ලදී.

පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.
කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය

වෙළුම 6, අංක 5 2003 මාර්තු - අප්‍රේල්

# රඹුටන් ගෙඩි වල හට ගන්නා අසාමාන්‍යතාවයක් පොකට් රඹුටන් (Pocket Rambutan)

ගොවීන් විසින් "පොකට් රඹුටන්" ලෙස හඳුන්වනු ලබන පහසුවෙන් ගැලවිය හැකි ලෙල්ල සහිත එහෙත් මාංශලය නොපිරුණු පැතලි රඹුටන් සමහර වගාවන්වල බහුල බව වාර්තා විය. මේ හේතුවෙන් ස්ථාන 3 ක නිරීක්ෂණ අධ්‍යයන කටයුතු 1999 වසරේදී ආරම්භ කරන ලදි. ඉහලම පොකට් රඹුටන් ප්‍රතිශතයක් 2000 වසරේදී දිවයිනේ සියළුම ප්‍රදේශ වලින් වාර්තා විය. 1999/2000 එල වාරයේදී කෑගල්ල උඩපොල වත්තෙන් වාර්තා වූ පොකට් රඹුටන් ප්‍රමාණය වගු අංක 1 හි දැක්වේ.

**වගුව 1 : උඩපොල වත්තෙන් වාර්තා වූ පොකට් රඹුටන් ප්‍රමාණය සහ ප්‍රතිශතයන්.**

| අස්වනු නෙළූ වර්ෂය/ මාසය | නෙළූ එල සංඛ්‍යාව | පොකට් රඹුටන් සංඛ්‍යාව | පොකට් රඹුටන් % |
|---|---|---|---|
| 1999 නොවැ. | - | - | - |
| 1999 දෙසැ. | 52200 | 4175 | 8% |
| 2000 ජන. | 86200 | 6890 | 8% |
| 2000 පෙබ. | 5200 | 415 | 8% |
| 2000 මාර්තු | - | - | - |
| 2000 අප්‍රේල් | - | - | - |
| 2000 මැයි | - | - | - |
| 2000 ජූනි | 15525 | 5400 | 35% |
| 2000 ජූලි | 32900 | 9870 | 30% |
| 2000 අගෝස්තු | 5900 | 1525 | 25% |
| මුළු අගය | 197925 | 28275 | 14% |

රඹුටන් ශාකයේ පුෂ්පිකරණය සඳහා අවම වශයෙන් සති 3 ක වියළි කාලයක් තිබීම අවශ්‍ය වේ. එහෙත් මල් හටගැනීමෙන් පසුව වියළි එනම් තෙතමනය අඩු තත්ව එල පිහිටීම අඩුවීමට සහ මාංශලය නොපිරුණු එල හට ගැනීම සඳහා හේතුකාරක වන බවත් එය අස්වැන්න සහ එලවල ගුණාත්මය අඩු කිරීමට බලපාන බවත් සොයාගෙන ඇත.

මල් පිපීමෙන් පසු එල පිහිටීම සඳහා ප්‍රමාණවත් ලෙස පාංශු තෙතමනය තිබිය යුතු වේ. එල පිහිටීමේ මුලික අවස්ථාවේ ජලය හිඟ තත්ව නිසා එල කුඩා වේ. එල වර්ධනයේ පසු කාලවලදී සිදුවන ජල හිඟතාවයන් නිසා එල පිරීම නිසි ලෙස සිදු නොවේ. සමහරක් ප්‍රභේද, එල හටගන්නා කාලයේ ඇතිවන ජල හිඟ තත්වයන්ට වැඩි අනුවර්තනයක් පෙන්වයි. දුර්වල ලෙස පිරුණු එලවල ගුණාත්මය ඉතා අඩුය. ආහාරයට ගත හැකි කොටස අඩුවීම, අධික ආම්ලිකතාව සහ සමහර අවස්ථාවලදී ප්‍රභේදයට විශේෂිත රසය අඩුවීම එවැනි ගුණාත්මක ලක්ෂණ වේ.

සමහර ප්‍රභේද, එල සෑදීමේ කාලසීමාවේ ඇතිවන ජල හිඟ තත්ව වලට වඩාත් පාත්‍ර වේ. මල්වාන, මැලයන් රතු සහ මැලයන් කහ ප්‍රභේද එවැනි ප්‍රභේද ලෙස හැඳින්විය හැකි අතර මේ නිසා වැඩි පොකට් රඹුටන් එල සංඛ්‍යාවක් හට ගත හැකිය. කෙසේ නමුත් ලබුකබෝලා ප්‍රභේදය මෙම ලක්ෂණ පෙන්නුම් නොකරන අතර, පාංශු තෙතමන පීඩාවන් සඳහා වැඩි අනුවර්තනයක් පෙන්වයි.

මෙම තත්වය මඟහැරවීම සඳහා පහත සඳහන් පාලන ක්‍රම උපකාරී වේ.

- මල් හටගැනීමෙන් පසු එල වර්ධනය වන කාලය තුළ ජල සම්පාදනය.
- කාබනික වසුන් භාවිතය.
- ප්‍රතිරෝධී ප්‍රභේද වගා කිරීම.
- එල හටගන්නා කාලයේදී ප්‍රමාණවත් ලෙස, පාංශු තෙතමනය රඳා පවත්නා ස්ථාන වගා කිරීම සඳහා තෝරා ගැනීම.

*මූලාශ්‍රය :* **ඉන්ද්‍රාණී මැදගොඩ මිය, පර්යේෂණ නිලධාරිනී, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, ගන්නොරුව.**

# මනුෂ්‍ය සහ සත්ව ආහාර ලෙස විභව බෝගයක් - සෝගම්

සෝගම් (*Sorghum bicolour* L.Moench) ශාකය 1930 දශකයේ දී මෙරටට හඳුන්වාදුන් බෝගයක් බැව් විශ්වාස කෙරේ. එය 1970 කාලයේ එවකට පැවති රජය දියත් කල ආහාර බෝග වැඩ සටහන යටතේ වැදගත් බෝගයක් බවට පත් විය. එම කාලය තුළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ප්‍රභේද ඇගයීමේ සහ අභිජනනය කිරීමේ කටයුතු කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස IS 2931 ප්‍රභේදය වගා කිරීම සඳහා නිදහස් කරන ලදි.

සෝගම් සත්ව ආහාරයක් ලෙස ආරම්භයේදී සළකනු ලැබුයේ ධාන්‍යය මෙන්ම සයිලේජ් සහ සෝගම් පිදුරු සත්ව ආහාරයක් ලෙස යොදා ගත හැකි ප්‍රභේද රාශියක් වූ බැවිනි. එමෙන්ම එය සමබර පෝෂණ සංයුතියක් සහිත පෝෂණීය මනුෂ්‍ය ආහාරයක් ද වේ. එය සමහර රටවල ප්‍රධාන ආහාරයක් වන අතර ඉන්දියාව වැනි රටවල ජනප්‍රිය ආහාරයක් වේ. සමහර රටවල් සෝගම් බෝගයේ කාර්මික අගය එනම් ඊතයිල් මධ්‍යසාරය වැනි දෑ නිෂ්පාදනය පිළිබඳව අධ්‍යයනය කර ඇත.

ජලය හිඟ තත්ව යටතේ පත්‍ර මැළවීම ඉක්මනින් සිදු නොවීමත්, ප්‍රමාණවත් තරම් ජලය ලැබෙන විට සීඝ්‍රයෙන් යථා තත්වයට පත්වීමක් නිසා සෝගම් බෝගය අඩු ජල අවශ්‍යතා සහිත බෝගයක් ලෙස හඳුන්වයි. කෙසේ වුවත් පසු කාලීනව අභිජනනය කරන ලද මාංශලමය කඳ සහිත ප්‍රභේද වැඩි ජෛව බරක් නිපදවන බැවින් වැඩි ජල ප්‍රමාණයක් අවශ්‍ය වේ.

පසුගිය වසර 6-7 ක කාලයක් තුළ පෙලපත් 200 කට වඩා වැඩි ප්‍රමාණයක් ඉහල ධාන්‍ය අස්වැන්න, සත්ව ආහාරමය අස්වැන්න, කුරුළු හානිය අඩුවීම, කඳ පනුවාගේ හානියට ප්‍රතිරෝධීවීම, වැනි විවිධ අරමුණු මුල් කරගෙන ඇගයීමට ලක් කරන ලදි. එම වැඩසටහන යටතේ ඉහළ අස්වනු දෙන වරණ රාශියක් පවත්වාගෙන යාම සිදු වේ. මෙම ප්‍රභේද වල ධාන්‍ය ශල්කමය ආවරණයකින් තොර බැවින් ගෘහ මට්ටමේ සැකසුම් සඳහා වුවද පහසු වේ. මේවා සෝගම් පිටි නිපදවීමට සහ සෘජුවම ආහාර සැකසීමේ කටයුතු සඳහා යොදගත හැකිය. කහමය සුදු පැහැති වර්ණයෙන් යුතු ධාන්‍ය සහිත මෙම ප්‍රභේද ටැනින් වලින් තොර වන අතර මනුෂ්‍ය හා සත්ව ආහාරයක් ලෙසද යොදගත හැකි වේ. මේවා "පිට්ටු" හා "රොටි" සඳහා විශේෂයෙන්ම සුදුසු වේ. ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය නුදුරු අනාගතයේදීම සෝගම් ප්‍රභේද කිහිපයක් නිර්දේශ කිරීමට සැලසුම් කර ඇත.

*මූලාශ්‍රය : කේ.එම්. කරුණාරත්න, පර්යේෂණ නිලධාරී, ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, මහඉලුප්පල්ලම.*

# ඒටී - 362 නව රතු සහල් ප්‍රභේදයක්

ශ්‍රී ලංකාවේ රතු සහල් පරිභෝජනය ක්‍රමයෙන් වැඩිවන බව පෙනෙන අතර මේ නිසා රතු සහල් වලට වසර පුරා ස්ථාවර ඉල්ලුමක් සහ වැඩි මිලක් දිවයිනේ බොහෝ ප්‍රදේශවලින් ලැබේ. මුළු වී වගා බිම් ප්‍රමාණයෙන් 20% ක් රතු සහල් ප්‍රභේද වගා කරනු ලබයි. ඒටී 353, බීජී 350, බී.ඩබ්ලිව්. 351 සහ ඒටී 303 වඩාත් බහුලවම වගාවෙන රතු සහල් ප්‍රභේද වේ. මේ අතුරින් ඒටී 353 ප්‍රභේදය වියළි සහ අන්තර් මාධ්‍ය කළාප වල වගාවෙන වඩාත් ජනප්‍රිය ප්‍රභේදය වන අතර එය මුළු වගාබිම් ප්‍රමාණයෙන් 5% ක් වේ. එහෙත් බීජී 350 සහ බී.ඩබ්. 351 ප්‍රභේදයන්හි ප්‍රභේද පාරිශුද්ධතාව පවත්වාගෙන යාම හා සම්බන්ධ ගැටළු පවතී.

ඒටී 303 මාස 3 වයස් කාණ්ඩයට අයත් වේ. මේ නිසා වැඩි අස්වනු දෙන වෙනත් රතු සහල් ප්‍රභේදයක් අවශ්‍ය වී තිබුණි. එබැවින් ඉහත අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2002 ජුනි මාසයේදී ඒටී 362 රතු සහල් ප්‍රභේදය වගා කිරීම සඳහා නිර්දේශ කරන ලදි. මෙම ප්‍රභේදයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු 95-4-3 අංකය යටතේ අම්බලන්තොට ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේදී සිදු කර ඇත.

96/97 මහ හා 97 යල කන්නවල පැවැත්වූ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් පරීක්ෂණ වලදී ඒටී 362 ප්‍රභේදය පාලිත ප්‍රභේද වූ ඒටී 353 ප්‍රභේදයට වඩා ඉහළ අස්වනු විභවයක්, සියළු පර්යේෂණ ස්ථාන වලදී පෙන්විය. එමෙන්ම වගු අංක 1 පරිදි වඩා හොඳ අනුවර්තිතා අගයක් පෙන්වන ලදි.

**වගුව 1: ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදාබැලීමේ පරීක්ෂණවලදී ලැබුන අස්වැන්න සහ අනුවර්තිතා අගය**

| කන්නය | ස්ථාන සංඛ්‍යාව | අස්වැන්න (හෙක්.ටොන්.) සහ අනුවර්තිතා අගය | |
|---|---|---|---|
| | | ඒටී 362 | ඒටී 353 |
| 96/96 මහ | 7 | 5.50 (1)* | 4.8 (5)* |
| 96 යල | 6 | 4.57 (2)* | 4.21 (9)* |

* අනුවර්තිතා අගය වරහන් තුළ දී ඇත.

ගොවි ක්ෂේත්‍රවල පැවැත්වූ ප්‍රභේද අනුවර්තිතා පරීක්ෂණවලදී විශේෂයෙන්ම වියළි සහ අන්තර් මාධ්‍ය කළාපවලදී ඒටී 362 වැඩි අස්වැන්නක් සහ අනුවර්තනයක් පෙන්නුම් කරන ලදි. ප්‍රතිඵල වගු අංක 2 හි සඳහන් කර ඇත.

**වගුව 2 : ප්‍රභේද අනුවර්තිතා පරීක්ෂණ** (VAT) **- වලදී ලැබුණු ධාන්‍ය අස්වනු සාරාංශය හා අනුවර්තිතා අංකය**

| කන්නය | කෘෂි දේශගුණික කලාප සහ පරීක්ෂණ පැවැත්වූ ස්ථාන සංඛ්‍යාව | මධ්‍යනය අස්වැන්න (හෙක්ටයාරයකට ටොන්) සහ අනුවර්තිතා අංකය | |
|---|---|---|---|
| | | ඒටී 362 | ඒටී 353 සහ/ හෝ බීඩබ්.267-3 |
| 98 යල | තෙත් කලාපය (12) | 3.16 (4) * | 3.57 (2) |
| | අන්තර් මාධ්‍ය සහ වියළි කලාපය (22) | 4.78 (2) | 4.19 (4) |
| 98/99 මහ | තෙත් කලාපය (15) | 4.29 (3) | 4.20 (4) |
| | අන්තර් මාධ්‍ය සහ වියළි කලාපය (24) | 5.51 (1) | 4.96 (4) |

* අනුවර්තිතා අංකය වරහන් තුළ දී ඇත.

ඒටී 362 ප්‍රභේදයේ අස්වනු සම්මත පාලිත ප්‍රභේදයට සමාන හෝ වඩා හොඳ බව වියළි හා අන්තර් මාධ්‍ය කලාපවලදී පෙන්නුම් කළත් තෙත් කලාපයේදී එවැනි තත්වයක් පෙන්නුම් නොකරන ලදී.

ඒටී 362 ප්‍රභේදය වඩා හොඳ අස්වැන්නක් විශාල පරිමාණ ප්‍රභේද අත්හදාබැලීමේ පරීක්ෂණ වලදී ද පෙන්නුම් කර ඇත. ප්‍රතිඵල සාරාංශය වගු අංක 3 හි සටහන් වේ.

**වගුව 3 : ඒටී 353 සහ ඒටී 362 ප්‍රභේද මහා පරිමාණ ප්‍රභේද අත්හද බැලීමේ පරීක්ෂණ වලදී ලබාදුන් ප්‍රතිඵල සාරාංශය.**

| ප්‍රභේදය | කන්නය | කෘෂි දේශගුණික කලාප අනුව ධාන්‍ය අස්වැන්න (හෙක්/ටොන්) | | |
|---|---|---|---|---|
| | | වියළි කලාපය | අන්තර් මාධ්‍ය කලාපය | තෙත් කලාපය |
| ඒටී 362 | 1999/2000 මහ | 4.32 (2)* | - | 4.77 (4) |
| | 2000 යල | 6.08 (4) | 6.07 (2) | 4.54 (5) |
| ඒටී 353 | 1999/2000 | 3.78 (2) | - | |
| | 2000 යල | 5.74 (4) | 5.70 (2) | 3.99 (5) |

* පරීක්ෂණ පැවැත්වූ ස්ථාන සංඛ්‍යාව වරහන් තුළ ඇත.

ඒටී 362 ප්‍රභේදයේ ගුණාත්මක පරාමිතික සඳහා ඒටී 353 සමඟ සංසන්දනය කරන ලදී (වගුව 4).

**වගුව 4 ගුණාත්මක පරාමිතික සංසන්දනය**

| ලක්ෂණය | ඒටී 362 | ඒටී 353 |
|---|---|---|
| ධාන්‍යවල ගුණාත්මක ලක්ෂණ | | |
| - මුළු සහල් අස්වැන්න | 71.2% | 70.5% |
| - නොකැඩුනු සහල් අස්වැන්න | 63.8% | 61.9% |
| - කැඩුනු සහල් ප්‍රමාණය | 7.4% | 8.6% |
| - මැද සුදු ඇට සහිත සහල් (White bellyrice) | ඩබ්.සී. 2 | ඩබ්.බී. 3 |
| - පාරභාෂ බව | අතරමැදි | අතරමැදි |
| - ජෙලටිනිකරණ උෂ්ණත්වය | අතරමැදි | අතරමැදි |
| වෙනත් ගුණාත්මක ලක්ෂණ | | |
| - ශුප්ත කාලය (සති) | 3-4 | 3-4 |
| - පිසූ පසු බත්වල රසය | හොඳයි | හොඳයි |

ඒටී 362 ප්‍රභේදය පිළිවෙලින් මහ සහ යල කන්න වලදී දින 105 සහ 110 කාල සීමාවන් වලදී පරිනතවීම සිදුවේ. එය හෙක්ටයාරයට යොදන නයිට්‍රජන් කිලෝග්‍රෑම් 80 ක් දක්වා ප්‍රතිචාර දක්වයි. එමෙන්ම ජෛව බලපෑම් සඳහා වඩා හොඳ ප්‍රතිචාර පෙන්නුම් කරයි (වගුව 5).

**වගුව 5 : ජෛවීය බලපෑම් සඳහා ප්‍රතිචාර සංසන්දනය**

| ජෛව සාධකය | ඒටී 362 | ඒටී 353 |
|---|---|---|
| කොළපාළුව | MR | MR/MS |
| බැක්ටීරියා පත්‍ර අංගමාරය | MR/MS | MR/MS |
| දුඹුරු පැල කීඩෑවා | MR | MR/MS |
| ගොක්මැස්සා | S | S |
| පැල මැක්කන් | S | S |

MR - මධ්‍යස්ථ ප්‍රතිරෝධී
MS - මධ්‍යස්ථ ග්‍රාහී
SS - පාත්‍රි

පිසීමට ගතවන කාලය අඩුවීම, කැඩෙන සහල් ප්‍රමාණය අඩුවීම, ක්ෂේත්‍රයේදී ධාන්‍ය හැලීම අඩුවීම, ඇද වැටීමට හොඳින් ඔරොත්තු දීම, අස්වනු පෑගීමේදී ධාන්‍ය පහසුවෙන් වෙන්වීම පිසූ සහල්වල ගුණාත්මය හා කැකුළු සහ තැම්බූ සහල් දෙවර්ගයේම පිසූ බත්වල රසය වැනි කරුණු සලකා ගොවීන් ඒටී 362 ප්‍රභේදය පිළිබඳව ධනාත්මක ප්‍රතිචාර දක්වා ඇත.

*මූලාශ්‍රය : බී.ඩී. පතිනායක මයා, ප්‍රධාන විද්‍යාඥ, වී පර්යේෂණ මධ්‍යස්ථානය, අම්බලන්තොට.*

# තක්කාලි වගාවනට වැළදෙන සර්කොස්පෝරා පත්‍ර දිලීර රෝගය

2003 යල කන්නයේ මඩකලපුව දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානයේ තක්කාලි වගාවට පත්‍ර දිලීර රෝගයක් වැළඳී ඇති බව පර්යේෂණ අංශයට වාර්තා කරන ලදී. අරලගන්විල පර්යේෂණ ආයතනයේ නිලධාරීන් විසින් එම ක්ෂේත්‍ර නිරීක්ෂණය කරන ලදී.

ඒ අනුව කේසි-1 තක්කාලි ප්‍රභේදයට මෙම ආසාදනය හටගෙන තිබුණි. පත්‍රවල කළු දුඹුරු පැහැති ලප ලෙස එය නිරීක්ෂණය විය. අක්‍රමවත් නෙක්රෝසීය ලප ලෙස හටගන්නා දිලීර ලප ක්‍රමයෙන් විශාල වී ඒකාබද්ධ වී විශාල පැල්ලම් ඇති කරයි.

පහත පත්‍රමතුපිට අධික ලෙස කොනිඩි බීජානු දක්නට ලැබුණි. පැල්ලම් වල මධ්‍ය කොටසේ බිඳ වැටීමක් නොමැතිව සම්පූර්ණ පැල්ලමම දුඹුරු පැහැ වී තිබුණි. කෙසේ නමුත් පත්‍ර නටු හා ශාක කඳේ රෝග ලක්ෂණ දක්නට නොලැබුණි.

මෙවැනි රෝගී තත්වයනට හේතු කාරකයා ලෙස සියුඩොසර්කොස්පෝරා ෆුලිජිනා *(Pseudocercospora fuligena* (Roldan) Deighton) ලෙස හඳුනාගන්නා ලද අතර එය ගන්නොරුව උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ ව්‍යාධිවිද්‍යාඥයින් විසින් සනාථ කරන ලදී. මෙය සර්කස්පෝරා දිලීරය තක්කාලි පත්‍රවලට ආසාදනය කරන බවට වාර්තා වූ ප්‍රථම අවස්ථාව මෙය විය.

දිලීරයේ පැතිරීම කොනිඩි බීජානු මගින් සිදු වේ. කොනීඩි බීජානු 5-8 ක් හෝ එයට වැඩි පොකුරක් ලෙස හට ගනී.

*මූලාශ්‍රය : ඩබ්.ඒ.ආර්.ටී. වික්‍රමආරච්චි මයා, පර්යේෂණ නිලධාරී, ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, අරලගන්විල.*




# පිපිඤ්ඤා බෝගයේ ලිංග නිර්ණය

පිපිඤ්ඤා වල (*Cucumis sativas*) පුමාංගි සහ ජායාංගි පුෂ්ප එකම වැලේ හටගනී. පුෂ්ප ඒකලිංගික වන අතර ජායාංගි පුෂ්පයේ පුමාංගි කොටස්ද, පුමාංගි පුෂ්පයේ ජායාංගි ව්‍යුහ කොටස්ද යටපත් වී ඇත.

ජායාංගි පුෂ්ප නිෂ්පාදනය ශාකයේ ජාන සංයුතිය මත රඳා පවතී. කෙසේ නමුත් වර්ධනයේ මූලික අවධියේ උෂ්ණත්වය, ආලෝක තීව්‍රතාව, දිවාදිග වැනි පරිසර සාධක මගින්ද පිපිඤ්ඤා ශාකයේ ජායාංගි පුෂ්ප ඇතිවීම තීරණය වේ.

සමහරක් රසායනික සංයෝග මගින් සහ අග්‍රස්ථ අංකුරය ඉවත් කිරීම මගින්ද ජායාංගි පුෂ්ප නිෂ්පාදනය වැඩි කර ගත හැක. සිල්වර් නයිට්‍රේට්, එත්‍රල් සහ බෝරික් අම්ලය වැනි රසායනික වෙනත් රටවල පිපිඤ්ඤා ශාකයේ ජායාංගි පුෂ්ප නිෂ්පාදනය වැඩි කිරීම සඳහා භාවිතා කරයි.

*මූලාශ්‍රය : ඒ. පාලමකුඹුර, පර්යේෂණ නිලධාරී, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නොරුව.*

**කෘෂි - තාක්ෂණ ....... ලුහුඬින්**

කාලීන තාක්ෂණික තොරතුරු සංක්ෂිප්තව තාක්ෂණවේදීන්, විශේෂයෙන්ම ව්‍යාප්ති නිලධාරීන් වෙත ලබාදීමේ අරමුණ උදෙසා කෘෂි - තාක්ෂණ පත්‍රිකාව ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය විසින් වරින් වර නිකුත් කරනු ලැබේ. මෙම පත්‍රිකාවේ අඩංගු තොරතුරු බොහොමයක්ම ප්‍රභවය වී ඇත්තේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ ආයතන සහ මධ්‍යස්ථාන වලිනි. තවද, වෙනත් ඕනෑම මූලාශ්‍රයකින් උපුටා ගත හැකිවුද, ක්ෂේත්‍රයේ ප්‍රායෝගිකව යොදාගත හැකිවුද, තොරතුරු වේ නම්, එවැනි දෑ ද කෘෂි - තාක්ෂණ පත්‍රිකාවෙහි අන්තර්ගත වනු ඇත.

*- සංස්කාරක -*

*සංස්කරණය*
*ජී. වාසුදේවා*

**පරිවර්තනය**
**ජයන්තා ඉලන්කෝන්**

වැඩිදුර තොරතුරු සඳහා විමසන්න : අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, තැ.පෙ. 18, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.

කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශයට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය මගින් ප්‍රකාශයට පත් කෙරිනි.

**රා.සේ.පි.**

**මුද්‍රිත ද්‍රව්‍යය**
**භාර නොදුනහොත් ආපසු යොමු කරන්න:**

**අධ්‍යක්ෂ,**
**ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය,**
**තැ.පෙ. 18,**
**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,**
**පේරාදෙණිය.**

මෙම පත්‍රිකාව, පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ පරිගණක අංශයේ පිටු සකස් කර ගන්නොරුව කෘෂිකර්ම මුද්‍රණාලයේ දී මුද්‍රණය කරන ලදී.